# විභාෂා

2014 පෙබරවාරි - මාර්තු | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි | දෙවන වෙළුම | 13 වැනි කලාපය






ලිපිනයක් අහිමි වතු කම්කරු පවුල් සඳහා ලිපිනයක් ලබාදීමේ සමාජ සත්කාර වැඩසටහනක් ලෙස පස්සර ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ 'විලාසම' වැඩසටහන අතරතුර ප්‍රදේශයේ වීදි නම් කෙරෙන පුවරු භාෂා තුනෙන් ම ඉදිවූයේ මෙසේ ය.

# මුදල් නෝට්ටුවේ අත්‍යවශ්‍ය පාඨ භාෂා තුනෙන් ම සඳහන් විය යුතුයි

## ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක්




මුදල් නෝට්ටු නිකුත් කිරීමේ දී භාෂා අයිතීන් උල්ලංඝණය වීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කරන ලද පැමිණිල්ලක් විභාගයට ගත් ශ්‍රේෂ්ඨාධිකරණය මින් ඉදිරියට නිර්මාණය කොට මුද්‍රණය කෙරෙන මුදල් නෝට්ටුවල අත්‍යාවශ්‍ය පාඨ භාෂා තුනෙන් ම මුද්‍රණය විය යුතු බවට නියෝග කරන ලදි.

මීට ඉහත දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර එම පැමිණිල්ල විභාගයට ගත් අවස්ථාවේ සිදු වී ඇති වරද පොදුවේ පිළිගත්

13 වැනි පිටුවට....

# සිංහල-දෙමළ ජාතික හැඳුනුම්පත නිකුත්වේ




ජාතික හැඳුනුම්පත සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන්ම ප්‍රකාශයට පත් කිරීම මෙරට ඉතිහාසයේ පළමු වරට පසුගිය (පෙබරවාරි 28) දා සිදුවිය. මහරගම ප්‍රදේශයේ පාසල් සිසුවකු ගොනු කළ පෙත්සමක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය ජාතික හැඳුනුම්පත භාෂා දෙකෙන්ම නිකුත් කරන ලෙස නියෝග කළේ පසුගිය ඔක්තෝබර් මාසයේ දී ය. එම නියෝගයට අනුව 2014 ජනවාරි 01 දිනසිට ජාතික හැඳුනුම්පත ද්විභාෂාවෙන් නිකුත් කළ යුතු වුව ද එය පෙබරවාරි අවසානය දක්වා පමා වී ඇත.

මෙම ද්විභාෂා හැඳුනුම්පත නිකුත්වීම පිළිබඳ පුවත වාර්තා කළ බොහෝ ජනමාධ්‍ය එය නිකුත් කිරීමට පසුබිම් වූ හේතුව පැහැදිලි කර තිබුණේ නැත. එක් පුවත් පතක සඳහන්ව තිබුණේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්තුමාගේ සංකල්පයක් අනුව මෙම හැඳුනුම්පත නිකුත් කෙරෙන බවකි.

ජනමාධ්‍ය මගින් එසේ යටපත් කළ ද ද්විභාෂා හැඳුනුම්පත යනු පුරවැසි ක්‍රියාකාරිත්වයක් මගින් ලැබූ පුරවැසි ජයග්‍රහණයක් ලෙස ඉතිහාසයට එක්වන බව විචාරකයෝ පවසති. **(මේ පිළිබඳ විශේෂ ලිපියක් 03 වැනි පිටුවෙහි පළ වේ.)**

# පාරිභෝගික උනන්දුව ඉහළට

පාරිභෝගික භාණ්ඩ ඇසුරුම්වල එම භාණ්ඩ පරිහරණය පිළිබද උපදෙස් හා විස්තර ඇතුළත් කිරීමේ දී ද්විභාෂා අයිතිය උල්ලංඝනය කර ඇති බව සඳහන් කරන පැමිණිළි ගණනාවක් තමන් වෙත ලැබී ඇති බව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පවසයි.

එම පැමිණිළි සම්බන්ධව මේ වන විට පාරිභෝගික ආරක්ෂණ අධිකාරියට දී ඇති බවත් ඉදිරියේ දී එම අධිකාරියෙහි නියෝජිතයන් සමඟ මේ පිළිබද සාකච්ඡා කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බවත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වැඩිදුරටත් පවසයි.

# උතුරේ ආරාධිත පාසැල් අතර භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ විවාද තරගාවලියක්

ශ්‍රී ලංකාවේ භාෂා ප්‍රතිපත්තිය තේමා කර ගනිමින් උතුරු පළාතෙහි දෙමළ හා සිංහල මාධ්‍ය දෙකෙන්ම පවත්වන ලද ආරාධිත පාසල් විවාද තරගාවලිය පසුගියදා සාර්ථකව නිම විය. "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, එහි භාවිතය හා ජනවාර්ගික සංහිඳියාව" යන මැයෙන් මෙම තරගාවලිය පැවැත්විණි.

2 පිටුවට...

## භාෂා අයිතීන් නොතකා සම්මුඛ පරීක්ෂණ අවලංගුයි

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මානව හිමිකම් කොමිසමෙන් නියෝග**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රසායනාගාර සහායක තනතුර සඳහා පැවැත්වීමට තිබූ සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝගයක් මත අත්හිටුවා ඇත. මෙයට හේතු වී ඇත්තේ මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් වෙත යවන ලද ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීමයි.

මේ හේතුවෙන් දෙමළ අයදුම්කරුවන් මහත් අපහසුතාවයට පත්ව ඇති අතර මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි භාෂා අයිතීන් උල්ලංඝණයක් වන බව කොමිසම පවසයි. ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන අධ්‍යක්ෂ වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම නියෝග 3ක් නිකුත් කර ඇත.

මේ අනුව වර්තමාන සම්මුඛ පරීක්ෂණ අත්හිටුවීමටත්, සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපි දෙමළ අයදුම්කරුවන් වෙත දෙමළ බසින් නැවත නිකුත් කිරීමටත්, සම්මුඛ පරීක්ෂණ නැවත අලුතින් පැවැත්වීමටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නියෝග කර ඇත.

# රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති උල්ලංඝණයන්ට එරෙහි පැමිණිලි 432 ක්

රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති උල්ලංඝණය කිරීමේ අවස්ථාවන් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2011 වසරේ සිට 2014 වසර වන විට පැමිණිලි 432 ක් ඉදිරිපත් කර ඇත.

ද්විභාෂා උල්ලංඝණයන් සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිසම වෙත සහ මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත් කළ පැමිණිලි 432 අතරින් සාර්ථක ප්‍රතිඵල කිහිපයක්ම ලබා ගැනීමට හැකි වී ඇති අතර තවත් පැමිණිලි ගණනාවක් විභාග වෙමින් පවතී.

මුදල් නෝට්ටුවල අත්‍යාවශ්‍ය පාඨ කිහිපයක් දෙමළ භාෂාවෙන් සඳහන් නොවීම, ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු දෙමළ භාෂාවෙන් සඳහන් නොවීම යන පැමිණිලි හැරුණු විට දේශීය වෙළඳ පොළෙහි අලෙවි කෙරෙන නිෂ්පාදන අසුරුම්වල දැක්වෙන අත්‍යාවශ්‍ය කරුණු ඉංග්‍රීසියෙන් පමණක් වීම, බැංකු ලියකියවිලි ඉංග්‍රීසියෙන් පමණක් වීම, දුම්රිය නිවේදන සිංහල බසින් පමණක් වීම ඇතුළු ද්වි භාෂා අයිතීන් උල්ලංඝණයන්ට සම්බන්ධ පැමිණිලි රැසක් රාජ්‍ය භාෂා කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

# ජාතික සමගියේ මහා සමුළුව අප්‍රේල් 07

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විවිධ ප්‍රජා සංවිධාන සමඟ එක්ව 2014 අප්‍රේල් මස 07 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ජාතික සමගියේ මහා සමුළුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාවේ විවිධ සමාජ ස්ථරයන් නියෝජනය කරමින් හා විවිධ ක්ෂේත්‍රයන්හි විද්වතුන්ගෙන් සමන්විත දහසකට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම සමුළුව පැවැත්වෙන බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පවසයි.එසේම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද මෙම සමුළුව සඳහා සහභාගිවීමට නියමිත අතර සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ වඩාත් පලදායී හා ධනාත්මක කතිකාවතක් මෙමගින් ගොඩනැගීමට හැකිවනු ඇතැයිද අමාත්‍යාංශය පවසයි.

මීට පදනම් වන්නේ 2012 ජූලි මස එළිදක්වන ලද සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවය.එම ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේ දී ශ්‍රී ලාංකික අනන්‍යතාවය ශක්තිමත් කිරීම සඳහා සාමූහික කැපවීමකින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරුණි.එසේම පොදු මානුෂීය වටිනාකම්,අන්‍යෝන්‍ය ගරුත්වය, තමාද සමාජයට අයත් වීමේ හැඟීම, සහ වගවීම යනාදී ගුණාංගයන් මත පදනම් වූ සාමකාමී සමාජයක් ගොඩනැංවීම උදෙසා විවිධ ආයතන සහ පුද්ගලයන්ගේ අදහස් හා යෝජනාද ලබා ගන්නා ලදි.

එහිදී හඳුනාගත් ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමත්, සහභාගීත්ව සහ බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් වෙනුවෙන් පවතින්නා වූ මූලාරම්භයන් ශක්තිමත් කිරීමත් මෙම සමුළුවෙහි අරමුණ බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය පවසයි.

## උතුරේ ආරාධිත පාසැල් අතර ..... 1 වැනි පිටුවෙන්

රටේ අනාගත සිසු පරපුර තුළ ද්විභාෂා භාවිතයේ වටිනාකම පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම විවාද තරඟාවලියේ මූලික අරමුණ වී තිබිණි. උතුරු පළාතෙහි දිස්ත්‍රික්කයන් පහෙහිම පාසැල් ආවරණය වන පරිදි මෙම තරඟාවලිය පවත්වන ලදී. දෙමළ මාධ්‍ය පාසල් දාසයක් සහ සිංහල මාධ්‍ය පාසල් හයක් මේ සඳහා උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලදී.

2013-10-18 දින ආරම්භ කරන ලද මෙම තරඟාවලියේ තරඟ වට හතරකින් පසු ශූරතාවය සහ අනුශූරතාවය ලබාගත් පාසල් තෝරා ගන්නා ලදී.

ඒ අනුව සිංහල මාධ්‍ය ශූරතාවය වවුනියාව පැරකුම් විද්‍යාලය ද අනුශූරතාවය වවුනියාව, අලගල්ල විද්‍යාලය ද දෙමළ මාධ්‍ය ශූරතාවය මුලතිව්, විද්‍යානන්ද විද්‍යාලය ද අනුශූරතාවය මුලතිව්, පුදුකුඩුරිප්පු මධ්‍ය විද්‍යාලය ද දිනා ගන්නා ලදී.

දක්ෂතම කථික - (සිංහල මාධ්‍ය) පැරකුම් මහා විද්‍යාලයේ ෂෙහානි ජයරත්න ශිෂ්‍යාව දිනාගන්නා ලද අතර මු/ විද්‍යානන්ද විද්‍යාලයේ එම්. තමිලරසන් ශිෂ්‍යයා සහ මු/ පුදුකුඩුරිප්පු මහා විද්‍යාලයේ එන්. එලිල් ශිෂ්‍යාව යන තරඟකරුවන් දෙදෙනාම දෙමළ මාධ්‍ය දක්ෂතම කථිකයන් වූහ.

යාපනය හින්දු විද්‍යාලය, යාපනය විද්‍යාලය, නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලය, කිලිනොච්චි මහා විද්‍යාලය, සිත්ති විනයාගර් හින්දු විද්‍යාලය, සෙන්ට් ෂෙල්වියර් පිරිමි විද්‍යාලය, කනගරායම්කුලම් මහා විද්‍යාලය, වව්නියා දෙමළ මහා විද්‍යාලය, කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය, මාන්කුලම් විද්‍යාලය, යාල්ටන් විද්‍යාලය සහ විපුලානන්ද විද්‍යාලය යන පාසල් දෙමළ මාධ්‍යයෙන් මෙම තරඟාවලිය සඳහා සහභාගී වූ අතර සිංහල මාධ්‍යයෙන් තරඟය සඳහා ව/ පැරකුම් විද්‍යාලය, ව/ අලගල්ල විද්‍යාලය සහ ව/ ධර්මපාල විද්‍යාලය යන විද්‍යාල සහභාගී විය.

2014/01/28 වන දින පස්වරු 1.00ට යාපනය විශ්ව විද්‍යාලයේ කයිලාසපති ශාලාවේදී මෙම විවාද තරඟාවලියේ ත්‍යාග හා කුසලාන ප්‍රදානෝත්සවය ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී ශූරතාවය, අනුශූරතාවය සහ දක්ෂතම කථිකයන් සඳහා කුසලාන ප්‍රදානය කරන ලද අතර සහභාගි වූ සියලුම පාසල් වෙනුවෙන් සහතිකපත් ප්‍රදානය කරන ලදී.

සහතිකපත්‍ර ප්‍රදානොත්සවයෙහි විශේෂිත අංගය වූයේ දෙමළ සහ සිංහල මාධ්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත කණ්ඩායම් දෙකක සහභාගීත්වයෙන් ද්වීභාෂා සුහද විවාදයක් පැවැත්වීමයි. මෙහිදී භාෂා පරිවර්තන උපකරණ ආධාරයෙන් සිංහල සහ දෙමළ මාධ්‍ය සිසුන් අතර සන්නිවේදනය සිදුකරන ලදී. විවාද තරඟාවලි වල දැකිය නොහැකි ඉතා විරල අත්දැකීමක් බැවින් මෙම සුහද විවාදය සඳහා බොහෝ දෙනාගේ අවධානය යොමුවිය.

# "සිංහල දෙමළ ජාතික හැඳුනුම්පත කාගේ ජයග්‍රහණයක් ද?"

සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් ම පුද්ගල තොරතුරු ඇතුළත් නව මුද්‍රිත ජාතික හැඳුනුම්පතක් හඳුන්වා දීම 2014 පෙබරවාරි 28 දින පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේදී සිදුවූ බවට පුවතක් 2014 මාර්තු මස 01 දා දිවයින පුවත්පතෙහි මුල් පිටුවේ ම ඡායාරූපයක් ද සහිතව පළවී තිබිණි.

දිවයින පුවත්පත හැරුණු විට තවත් පුවත්පත් කිහිපයකම මේ පුවත ප්‍රමුඛත්වයකින් යුතුව පළකර තිබිණි. සමහර පුවත්පත් ඊට පෙර සිටම මේ කෙරෙහි අවධානය යොමුකර තිබින. උදාහරණයක් ලෙස පෙබරවාරි මස මුල් සතියේ දී ලක්බිම පුවත්පත මේ පිළිබඳ ඡායාරූපයක් ද සහිත පුවත්පතක් පළකරමින් නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ කටයුතු මේ දිනවල පරීක්ෂණ මට්ටමෙන් සිදුවෙමින් තිබෙන බව වාර්තා කර තිබිණ.

මේ සියලු වාර්තා මගින් ප්‍රකාශිත අදහසක් වූවේ නව හැඳුනුම්පත හඳුන්වා දීම හුදෙක් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි අවශ්‍යතාවය මත සිදුවූ බවකි. ඉහත කී ලක්බිම පුවත්පත ඒ බව වාර්තා කර තිබුණේ මෙසේ ය.


"දැනට භාවිත කරන ජාතික හැඳුනුම්පතේ ගැටලු මගහැරවීම සඳහා එහි කොමසාරිස් ජනරාල් ආර්. එම්. එස්. සරත් කුමාර මහතාගේ සංකල්පයක් මත නව තාක්ෂණයෙන් යුත් හැඳුනුම්පතක් නිකුත්කිරීමට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ අංශය ලහි ලහියේ මේ දිනවල වැඩ ආරම්භ කර ඇත."


මාර්තු 01 දා දිවයින පුවත්පත ඒ පිළිබඳ වාර්තා කර තිබුණේ මෙසේ ය.

"සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන්ම පුද්ගල තොරතුරු ඇතුළත් නව මුද්‍රිත ජාතික හැඳුනුම්පත ඊයේ (28 වැනිදා) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙනු ලැබී ය."

මෙම ජනමාධ්‍ය වාර්තා මගින් කියැවෙන්නේ නව ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ආර්. එම්. එස්. සරත් කුමාර මහතාගේ අවශ්‍යතාවය නිසාම ප්‍රකාශයට පත් වූ බවකි.

වෙනත් කිසිදු පුරවැසි ක්‍රියාකාරීත්වයක් එය පිටුපස පැවති බව මේ කිසිදු ජනමාධ්‍ය වාර්තාවකින් ප්‍රකාශයට පත් වී නැත. ඒ අනුව මෙරට සාමාන්‍ය පුරවැසියන්ද එවැනි අවබෝධයකට පැමිණීම ස්වභාවික ය. මක්නිසාද යත් සාමාන්‍ය මිනිසුන් තොරතුරු ලබාගන්නේ මෙබඳු ජනමාධ්‍ය




නව හැඳුනුම්පත පිළිබඳ ජනමාධ්‍ය වාර්තා

**"සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන්ම ජාතික හැඳුනුම්පත නිකුත් වීම මෙරට පුරවැසියාගේ ජයග්‍රහණයකි. එහෙත් එම ජයග්‍රහණය වාර්තා කිරීමේදී ඒ පිටුපස සත්‍යය කතාව වාර්තා නොකිරීමෙන් මෙරට බොහෝ ජනමාධ්‍ය තම වගකීම පැහැර හැර තිබේ."**

වාර්තාකරුවන් ගෙන් නිසා ය. එහෙත් ඒ සැබෑ කතාවක්ද? සැබැවින්ම සිදුවූයේ කුමක්ද? මේ පිළිබඳව සැබෑ තොරතුරු දැනගැනීම මෙරට සාමාන්‍ය පුරවැසියාගේ අයිතියකි. එමගින් මෙරට පුරවැසි ක්‍රියාකාරීත්වයේ ශක්තිය තේරුම් ගැනීමේ අවස්ථාවක් පුරවැසියාට උදාවන බැවිනි.

භාෂා ද්විත්වයෙන්ම පුද්ගල තොරතුරු ඇතුළත් ජාතික හැඳුනුම්පතක අවශ්‍යතාවය මෙරට දිගුකලක සිට පැවැත එන්නකි. සිංහල හා දෙමළ රාජ්‍ය භාෂාව ලෙස පවතින රටක පුරවැසියා සතු මූලික ලේඛනයක් වන ජාතික හැඳුනුම්පත තනි භාෂාවකින් නිකුත් වීම ඒ රටෙහි භාෂා අයිතිය උල්ලංඝනය කිරීමක් වන බැවිනි.

මේ හේතුවෙන් මෙරට භාෂා අයිතීන් පිළිබඳ උනන්දුමත් පුරවැසියන් මේ පිළිබඳ විවිධ අදහස් පළ කර තිබූ නමුත් එහිලා තීරණාත්මක මැදිහත් වීමක් සිදුවූවේ නැත.

මෙරට උසස් පෙළ සිසුවකුගෙ න් 2013 වසරේදී එවැනි තීරණාත්මක මැදිහත් වීමක් සිදුවිය. මහරගම ප්‍රදේශයේ පදිංචි කොළඹ ආනන්ද විද්‍යාලයේ උසස් පෙළ හදාරමින් සිටි අනුරාධ ප්‍රසාද් ධනංජය ගුරුගේ එම පාසැල් සිසුවා ය. ජාතික හැඳුනුම්පත සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම නිකුත් කරන ලෙස ඉල්ලා සිටි එම පාසල් සිසුවා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළේ ය.

අගවිනිසුරු මොහාන් පීරිස් මහතා ඇතුළු ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් හමුවේ තම පෙත්සම ඉදිරිපත් කරමින් අනුරාධ ප්‍රසාද් කියා සිටියේ ජාතික හැඳුනුම්පත සිංහලෙන් පමණක් නිකුත් කර ඇති නිසා එය රැගෙන දෙමළ භාෂාවෙන් පරිපාලන කටයුතු සිදු කෙරෙන උතුරු නැගෙනහිර පළාත්වලට ගොස් රාජකාරි කටයුතු කර ගැනීමට යාමේදී මහත් අසීරුතාවයකට මුහුණ පෑමට සිදුවන බවයි.

පසුගිය වසරේ ඔක්තෝම්බර් 21 වැනිදා මෙම පෙත්සම යළි කැඳවූ අවස්ථාවේ 2014 ජනවාරි 01 වන දා සිට නිකුත් කෙරෙන සියලු ජාතික හැඳුනුම්පත් ද්විභාෂාවෙන් නිකුත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාට නියෝග කළේ ය.

එපමණක් නොව, STFR 93 of 2013 දරණ එම පෙත්සම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වැඩිදුරටත් දැනුම් දී ඇති පරිදි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වසර තුනක් තුළ ජාතික හැඳුනුම්පත භාෂා තුනෙන්ම නිකුත් කිරීමට පියවර ගත යුතු ය.

එහෙත් එම ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය නිසිලෙස ඉටුකිරීමට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වරයාට හැකි වූවේ නැත. එම නියෝගය අනුව 2014 ජනවාරි 01 දා සිට ද්විභාෂික හැඳුනුම්පත නිකුත් කළ යුතුව තිබූ නමුත් විභාෂා පුවත් හසුන මගින් කළ සොයාබැලීමේදී දැනගැනීමට ලැබුණේ පෙබරවාරි මාසය වන විටත් එහි කටයුතු සම්පූර්ණ වී නොතිබුණු බවයි.

එය පැහැදිලිවම ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය කඩ කිරීමකි. කෙසේ වෙතත් නියමිත දිනට මාස දෙකකට පසුව හෝ එම හැඳුනුම්පත නිකුත් කිරීමට හැකිවීම තමන් ගේ ජයග්‍රහණයක් ලෙස හුවා දැක්වීමට කොමසාරිස්වරයා මහත් උත්සාහයක් ගෙන ඇති බව ඒ පිළිබඳ පසුව පළවූ ජනමාධ්‍ය වාර්තා මගින් පැහැදිලි විය. එය කොතරම් සදාචාර සම්පන්න දැයි කොමසාරිස්වරයා අවංකව කල්පනා කළ යුතු ය.

අනෙක් අතින් මෙහිදී ජනමාධ්‍ය හැසිරී ඇති ආකාරයද පැහැදිලිව ගැටලු සහගත ය. සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන්ම ජාතික හැඳුනුම්පත නිකුත් වීම මෙරට පුරවැසියාගේ ජයග්‍රහණයකි. එහෙත් එම ජයග්‍රහණය වාර්තා කිරීමේදී ඒ පිටුපස සත්‍යය කතාව වාර්තා නොකිරීමෙන් මෙරට බොහෝ ජනමාධ්‍ය තම වගකීම පැහැර හැර තිබේ. සිංහල ජනමාධ්‍ය මෙන්ම ඉංග්‍රීසි ජනමාධ්‍යද මේ පිළිබඳ කරුණු වාර්තා කර ඇත්තේ නිසි සොයා බැලීමෙන් තොරව බව පැහැදිලි ය.

මෙය සිතා මතා සැලසුම් සහගතව සිදුකළ වරදක් නොවන්නට පුළුවන. එහෙත් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුකරන අසම්පූර්ණ වාර්තාකරණයේ අයහපත් ප්‍රතිඵල භුක්ති විඳීමට සිදුවන්නේ පාඨකයාට ය.

ඒ අනුව බලන විට මෙම වාර්තාකරණය තුළ ගිලිහී ගොස් තිබෙන්නේ කතාවේ වැදගත්ම කොටස ය. දැනුවත් පුරවැසි මැදිහත් වීමෙන් හා පුරවැසි ක්‍රියාකාරීත්වය මගින් තම අයිතීන් දිනාගත හැකි බව කියැවෙන්නේ එම කොටසෙනි. විශේෂයෙන් පාසල් සිසුවකුගේ මැදිහත් වීමෙන් ජාතික ප්‍රතිපත්තියක් වෙනස් කිරීමට හැකිවීම මෙරට ඉතිහාසයේ සන්ධිස්ථානයකි. එවැනි පුවතක් කියැවීමට ලැබීමෙන් සෙසු පාඨකයා තුළ ද තම අයිතීන් පිළිබඳ නව උද්‍යොගයක් ඇතිවීම ස්වභාවික ය. තම අයිතීන් සඳහා නැගී සිටීමට සාමාන්‍ය පුරවැසියා තුළද පෙළඹවීමක් ඇති කිරීමට එවැනි වාර්තාකරණයන් හේතුවෙයි. එවැනි පුවත් නිසිලෙස වාර්තා කිරීම ජනමාධ්‍යයෙහි සමාජ වගකීමක් වන්නේ එබැවිනි.

**- ගවේෂි**

# ද්විභාෂා අයිතිය පිළිබඳ උනන්දුව ඉහළට පුරවැසියන්ගෙන් පැමිණිලි ගලයි

සිංහල හා දෙමළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා බවට පත් කරන ලද්දේ මෙරට ඉතිහාසයෙහි සිදු වූ බරපතල වරදක් නිවැරදි කිරීම සඳහා ය. එහෙත් තවම ප්‍රශ්නය විසඳී ඇති බවක් නොපෙනේ. බොහෝ රාජ්‍ය ආයතන තවමත් වැඩ කරන්නේ එක් භාෂාවකිනි.

මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා නව ආයතන පිහිටුවමින්, චක්‍රලේඛ ගණනාවක් ද නිකුත් කර ඇතත් තවම ප්‍රශ්නය විසඳී නැත.

මේ සඳහා කිසියම් පුරවැසි ක්‍රියාකාරිත්වයක අවශ්‍යතාව පැන නැග ඇත්තේ එබැවිනි.

එම තත්ත්වය වටහා ගනිමින් ඇරඹුණු "සුළුතර ප්‍රජාවගේ භාෂා අයිතීන් ප්‍රවර්ධන වැඩසටහන" මේ වන විට තවත් සංවිධාන ගණනාවක් සම්බන්ධ කර ගනිමින් භාෂා අයිතීන් පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ඇත.

එම වැඩසටහන් මගින් භාෂා අයිතිය පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමේ අරමුණු කිහිපයක් විය. ඒ අතරින් එක් ප්‍රධාන අරමුණක් වූයේ තම අයිතීන් වෙනුවෙන් නැගී සිටීම සඳහා පුරවැසියන් තුළ පෙළඹීමක් ඇති කිරීම ය.

නීති තිබුණ ද ඒවා ක්‍රියාත්මක නොවීමට බලපෑ එක් ප්‍රධාන හේතුවක් වූයේ ඒ පිළිබඳ පුරවැසියන් තුළ ප්‍රමාණවත් දැනුවත් භාවයක් හා උනන්දුවක් නොතිබීම ය.

දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණක් වූයේ පුරවැසියන් තුළ එම උනන්දුව හා උද්‍යෝගය ඇති කිරීමයි. මේ වන විට එම උනන්දුව වර්ධනය වී ඇති ආකාරය මේ සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි වර්ධනය වන ආකාරය අනුව වටහා ගත හැකි ය.

රටේ විවිධ ප්‍රදේශ හා විවිධ ආයතන නියෝජනය කරමින් ලැබුණු තොරතුරු මත පදනම්ව, සකස් කොට රාජ්‍ය භාෂා කොමිසම වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි ගණනාවක් සංක්ෂිප්තව පහත දක්වන්නේ ඒ පිළිබඳ මහජන උනන්දුව තවදුරටත් වර්ධනය කිරීම සඳහා මග පෙන්වන මාර්ගෝපදේශනයක් වශයෙනි.

**නීති තිබුණ ද ඒවා ක්‍රියාත්මක නොවීමට බලපෑ එක් ප්‍රධාන හේතුවක් වූයේ ඒ පිළිබඳ පුරවැසියන් තුළ ප්‍රමාණවත් දැනුවත් භාවයක් හා උනන්දුවක් නොතිබීම ය. දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණක් වූයේ පුරවැසියන් තුළ එම උනන්දුව හා උද්‍යෝගය ඇති කිරීමයි. මේ වන විට එම උනන්දුව වර්ධනය වී ඇති ආකාරය මේ සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි වර්ධනය වන ආකාරය අනුව වටහා ගත හැකි ය.**

"

## ලිපි ලේඛන පිළිබඳ පැමිණිලි

- පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ලිපි සිංහල භාෂාවෙන් පමණක් ලබාදීම පිළිබඳ පැමිණිල්ල
- අධිකරණ අමාත්‍යාංශය මගින් ලබාදෙන සාම විනිසුරු හැඳුනුම්පත් නිකුත් කිරීමේ ලිපි සිංහල භාෂාවෙන් පමණක් ලබාදීම පිළිබඳ පැමිණිල්ල
- සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය මගින් ලබාදෙන ලිපි සිංහල භාෂාවෙන් පමණක් ලබාදීම පිළිබඳ පැමිණිල්ල
- වනජීවී දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන පුද්ගලික/රජයේ බදු ඉඩම්වලින් දැව ඉවත්කරගැනීමට දෙන බලපත්‍ර සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කිරීම පිලිබඳ පැමිණිල්ල
- මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් වලිගාමම් ප්‍රාදේශිය සභාව වෙත එවන ලිපි සිංහලෙන් පමණක් මුද්‍රණය කර තිබීම සම්බන්ධ පැමිණිල්ල
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පළාත් පාලන ආයතනවල නිලධාරීන් වෙත යවන ලද විශ්‍රාම වැටුප් සම්බන්ධ ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් පළාත් පාලන ආයතන වෙත යවන ලද උතුරු පළාත් ප්‍රාදේශීය ක්‍රම සම්පාදන කමිටුවේ පළමු සැසිවාරය සම්බන්ධ ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් වලිගාමම් ප්‍රාදේශිය සභාව වෙත එවන ලිපි සිංහලෙන් පමණක් මුද්‍රණය කර තිබීම සම්බන්ධ පැමිණිල්ල
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් උතුරු පළාත් හදිසි පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්ට එවන ලද ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් එවීම සම්බන්ධ පැමිණිල්ල (2013:02:05/ 2013:03:17)
- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පළිබෝධනාශක භාවිතය පිළිබඳ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශවලට යවන ලද ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන විශේෂ නිවේදන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කිරීම පිලිබඳ පැමිණිල්ල
- ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ධීවර කාර්මිකයන් සඳහා හැඳුනුම්පත් ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍ර සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කිම පිලිබඳ පැමිණිල්ල
- කන්කසන්තුරය පොලිස් අධිකාරී කාර්යාලය මගින් වලිගාමම් උතුරු ප්‍රාදේශීය සභාවට යවන ලද ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- යාපනය මැතිවරණ කාර්යාලය මඟින් උතුරු පළාතේ පළාත් පාලන ආයතන වෙත යවන ලද ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- දෙහිවල ගල්කිස්ස මහනගර සභාව මගින් පුරවැසියන් සඳහා නිකුත් කරනු ලබන සේවා පත්‍රිකා

සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කිරීම සම්බන්ධ පැමිණිල්ල.

- අඩ්ඩාලච්චේනෙ ප්‍රාදේශීය සභාව මඟින් නිකුත් කරනු ලබන ගමන් වියදම් ඉල්ලීමේ පෝරමය සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සම්බන්ධව උතුරු පළාත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට එවන ලද ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර තිබීම සම්බන්ධ පැමිණිල්ල
- අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් යවන ලද සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟ සම්බන්ධ ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- වවුනියාව නගර සභාව මඟින් නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් නිකුත් නොකිරීම සම්බන්ධ පැමිණිල්ල
- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මදුරු මර්දන කටයුතු සාර්ථකවම සිදුකරන පළාත් පාලන ආයතනය තේරීම පිළිබඳ හා පළාත් පාලන ආයතනවලට යවන ලද ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- කන්කසන්තුරෙර මහජන බැංකුව මඟින් රාජ්‍ය සේවකයන්ගේ නිවාස ණය සම්බන්ධ ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරී මණ්ඩලය මඟින් නිකුත් කළ කොඩි අලෙවිය පිළිබඳ ලිපි සිංහල භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින්, පළිබෝධනාශක භාවිතය පිලිබඳව සියළුම පළාත් පාලන ආයතන ලේකම්වරුන්ට හා සභාපතිවරුන්ට යවන ලද ලිපි සිංහල භාෂාවෙන් පමණක් එවීම සම්බන්ධ පැමිණිල්ල
- ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ
- රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- කන්කසන්තුරෙර මහජන බැංකුව මඟින් රාජ්‍ය සේවකයන්ගේ නිවාස ණය සම්බන්ධ ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් යැවීම සම්බන්ධ පැමිණිල්ල
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මඟින් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන් වෙත නිකුත් කරනු ලබන ලිපි සිංහල භාෂාවෙන් පමණක් නිකුත්කිරීම සම්බන්ධ පැමිණිල්ල
- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සම්බන්ධව උතුරු පළාත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට එවන ලද ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර තිබීම සම්බන්ධ පැමිණිල්ල
- ත්‍රිකුණාමලය උප්පැන්න, විවාහ, මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් ලබාදෙන උප්පැන්න සහතික දෙමළ භාෂාවෙන් පමණක් ලබාදීම සම්බන්ධ පැමිණිල්ල

**රටේ විවිධ ප්‍රදේශ හා විවිධ ආයතන නියෝජනය කරමින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ලැබී ඇති මෙබඳු පැමිණිලි මගින් පැහැදිලි වන්නේ භාෂා අයිතීන් පිළිබඳ උනන්දුව රට පුරා වර්ධනය වෙමින් ඇති ආකාරයයි. එසේම ද්විභාෂා අයිතිය පිළිබඳ මහජන උනන්දුව තවදුරටත් වර්ධනය කෙරෙන මාර්ගෝපදේශ ලෙස ද මෙම පැමිණිලි සැලකිය හැකි ය.**

## නාම පුවරු පිළිබඳ පැමිණිලි

- පුදුකුඩිඉරිප්පු පාසලේ නාම පුවරුව සිංහල මාධ්‍යයෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නාම පුවරුව සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කොළඹ මහ නගර සභාවේ වාහන නැවැත්වීමේ ගාස්තු ඇතුළත් නාම පුවරුව සිංහල සහ දෙමළ භාෂාවෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපිට ඇති කාලගුණ වාර්තාව පිළිබඳ තොරතුරු ඇතුළත් දැන්වීම් පුවරුව දෙමළ සහ සිංහල මාධ්‍යයෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනයේ නාම පුවරුව සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- වෙරළබඩ පොලිස් ස්ථානයේ නාම පුවරුව දෙමළ භාෂාවෙන් නිවැරදිව සඳහන් නොවීම සම්බන්ධ පැමිණිල්ල
- ස්නායු වෛද්‍ය ආයතනයේ නාම පුවරුව දෙමළ භාෂාවෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කුරුවිට බන්ධනාගාරයේ සියලුම දැන්වීම්පුවරු සිංහල භාෂාවෙන් පමණක් ප්‍රදර්ශනය වීම සම්බන්ධ පැමිණිල්ල
- කුමන ජාතික වනෝද්‍යානයේ මහජන ප්‍රදර්ශන දැන්වීම් පුවරු දෙමළ භාෂාවෙන් සහ ඇතැම් දැන්වීම් පුවරු සිංහලෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල
- නාරාහේන්පිට පොලිස් නිල රථයේ පොලිස් යන්න දෙමළ භාෂාවෙන් සඳහන් නොවීම සම්බන්ධ පැමිණිල්ල
- කොළඹ හෙද විදුහලේ නාම පුවරුව දෙමළ භාෂාවෙන් ප්‍රදර්ශනය නොවීම සම්බන්ධ පැමිණිල්ල

රටේ විවිධ ප්‍රදේශ හා විවිධ ආයතන නියෝජනය කරමින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි මගින් පැහැදිලි වන්නේ භාෂා අයිතීන් පිළිබඳ උනන්දුව රට පුරා වර්ධනය වෙමින් ඇති ආකාරයයි. එසේම ද්විභාෂා අයිතිය පිළිබඳ මහජන උනන්දුව තවදුරටත් වර්ධනය කෙරෙන මාර්ගෝපදේශ ලෙස ද මෙම පැමිණිලි සැලකිය හැකි ය.




# විලාසම

## ලිපිනය අහිමි වූ ප්‍රජාවකට ලිපිනයක් හිමිවීම....

**මතුපිටින් බලන විට පුද්ගලයකුගේ ලිපිනය ඉතා සරල දෙයක් ලෙස පෙනුන ද මිනිසකුගේ ජීවිතයට එහි ඇති සංකීර්ණ සම්බන්ධය කොතරම්දැයි මෙහි දැක්වෙන අත්දැකීම් මගින් පැහැදිලි වේ. මෙතරම් සංකීර්ණ ගැටලුවකට විසඳුම් සෙවීම සඳහා වගකිවයුත්තන්ගේ අවධානය මෙතෙක් යොමු නොවීම බරපතල ගැටලුවක් වන්නේ එබැවිනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය මගින් මේ ගැටලුවට විසඳුමක් සෙවීමට ඉදිරිපත් වූයේ එවැනි පසුබිමක් යටතේ ය. විලාසම යනු ඒ විසඳුමයි**

ආගරපතන දෙමළ විද්‍යාලයේ ඉගෙනුම ලබන එච්. දුනිල්රාජ්ට මෙතෙක් ලියුම් ලැබුණේ ලැයිම් අංකයකටයි. ලියුම නිවසට ලැබීමේ ක්‍රමයක් නොතිබිණි. ඒ ගැන ඔහු මෙසේ කියයි.

"අපේ ලැයිම් අංකය 15. අපට හැමදාම ලියුම් එන්නෙ ලැයිම් අංකයට. අපට අපේම ලිපිනයක් නැතිකම නිසා අපි බොහෝ ගැටලුවලට මුහුණ දී තියෙනවා. අනෙක් අතින්, අපට මෙය මොන තරම් අවනම්බුවක් ද? අපේ හැම ගෙදරකටම අංකයක් දීල තනි ලිපිනයක් ලැබෙනවා නම් අපට මොන තරම් සතුටක්ද?"

වතුකරයේ ලියුම් බෙදීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ පස්සර, කිතුල්ගල ඩිවිෂන් තැපැල් ස්ථානාධිපතිවරයා පැහැදිලි කළේ මෙසේ ය.

"වත්තෙන් පත්කර ඇති තැපැල් සේවකයෙක් තැපැල් මල්ල අරන් යනවා. එයට විශේෂ ගාස්තුවක් ලෙස වාර්ෂිකව පොඩි ගාස්තුවක් අය කරනවා. වත්තට එන සියලු ලිපිවල තොරතුරු සටහන් කරන්නේ ඒ පොතේ. ලියාපදිංචි ලිපි හැර සියලු ලිපි සාමාන්‍ය ලිපි මල්ලක බහා වත්තේ කළමනාකරු වෙත යවනවා. නමුත් ලියුම් බෙදීම සතුටුදායක නැහැ. වත්තේ ප්‍රධාන කාර්යාලයේ දී ඒ ඒ ඩිවිෂන්වලට ලිපි වෙන් කරලා චෙක්රෝල ගෙනයන පුද්ගලයා අත යැව්වම පෙරට්ටුවේ දී ක්ෂේත්‍ර නිලධාරියා විසින් ලියුම් නියමිත අයට ලබාදීමයි සිදුවන්නේ. එය අසාර්ථකයි. නියමිත අයට ලැබෙන්නේ නැහැ. ඔහු නොපැමිණියහොත් ලියුම එතැන තබා ගන්නවා.

ලියාපදිංචි ලිපි සඳහා නිවේදනයක් ප්‍රසිද්ධ කළත්, එය පවා ඔවුන් දකින්නේ නැහැ. එනිසා ලියාපදිංචි ලිපි දෙතුන් සීයක් නිතරම අප ළඟ ගොඩගැසී තිබෙනවා. අප නැවත නැවතත් නිවේදන නිකුත් කරනවා. මානුෂිකත්වය සලකා ලිපි මාස ගණන් තියාගත්තත් අපට එහෙම බලයක් නැහැ. ඉන්පසු ආපසු යවනවා.

එකම නම තිබීම හා ලිපිනයන් නොතිබීම නිසා අප බැණුම් අහන අවස්ථාත් තියෙනවා. මේ නිසා හැම කම්කරුවෙකුටම තම අනන්‍යතාව තහවුරු වන පරිදි නිවැරදි ලිපිනයන් සකස් කිරීම කාලෝචිතයි.




මෙම ගැටලුවේ සංකීර්ණත්වය පැහැදිලි කරගැනීම සඳහා වතුකරයේ ලියුම් බෙදන තැපැල්කරුගේ අදහස් ද ප්‍රයෝජනවත් ය. වතුකරයට ලියුම් බෙදීමෙහි නිරතව සිටින දයාලන් මෙසේ කියයි.

"නමට එකම මුල් අකුරු තියෙන හතර දෙනෙක් ඉන්නවා. ඒ 4 දෙනාගේ ලිපි බෙදන්න යන විට නිවාස අංක නැහැ. මම එකිනෙකාගෙන් විමසා බලනවා. ඒ වාගේ 4 දෙනෙකුගෙන් අහන විට, ඒ 4 දෙනා සමහර විට එයා ද, මෙයා ද යන සැකයක් මතුවෙනවා. එවැනි අවස්ථාවලදී අදාළ 4 දෙනාවම කාර්යාලයට කැඳවනවා. පසුව පෝස්ට් මාස්ටර් ඉදිරිපිට එම ලිපිය විවෘත කර, එතුමා ඉදිරිපිටදී මෙම ප්‍රශ්නය විසඳනවා. මෙය ඉතාම බරපතල අඩුපාඩුවක්. ඊට හේතුව ලිපි බෙදන මහතා ගෙදරට ඇවිත් ලබාදුන්නත් පසුව එය ස්ථිර කරගන්නට බස් ගාස්තු වියදම් කර තැපැල් ස්ථානයට ගොසින් එය ලබාගැනීමට සිදු වී තිබීමයි.

පී.රාජේන්ද්‍රන් යනුවෙන් දෙදෙනෙක් සිටිනවා. ඒ අයට සම්බන්ධ පරීක්ෂණ කැඳවීම් ලිපිය භාර දීමට කාර්යාලයට කැඳවා ඒ අයගේ නඩුව විසඳා එම ලිපිය භාරදීමට පැය ගණනක් ගතවෙනවා. පසුදා පෙරවරු 10ට ඔහු යායුත්තේ අම්පාරට. ඔහු බොහෝ අපහසුතාවයට ලක්වෙනවා.

චෙක්පත් පාර්සල් බොහොමයක් විශාල වශයෙන් ලැබෙනවා. මෙවැනි නිවාස අංක නොමැතිව ඒවා භාර දීමේ අපහසුතාවයන්ට මුහුණ දෙනවා. එම චෙක්පත් සියල්ලම කාර්යාලයට භාරදීමට අපට සිදුවී තිබෙනවා. එක් පුද්ගලයකුට එන එක් චෙක්පතක් කාර්යාලයක විවෘත කර ඊ.පී.එෆ් අංකය බලා අදාළ පුද්ගලයාට එම චෙක්පත් භාරදීමට සිදුවී තිබෙනවා. මෙය බරපතල ප්‍රශ්නයක්. ආරක්ෂාව මත මේ විදියට කළත් පුද්ගලික වශයෙන් ඔවුන්ට ලැබිය යුතු අයිතිවාසිකම් කඩවී තිබෙනවා.

ඡන්ද කාඩ්පතත් ලබාදීමත් අප හරහයි සිදුවන්නෙ. අපි ඒවා වත්තේ ඇති පිල්ලෙයි මඩුවම් හා කාර්යාලය සහ පොදු ස්ථානවල තෝරා සියලුදෙනා කැඳවා එකිනෙකාට ඔවුන්ගේ නම්, මුලකුරු වෙනත් ලියකියවිලි නිසි ලෙස තිබේදැයි තහවුරු කර, එය නිවැරදි නම් ඡන්ද කාඩ් එක දෙනවා."

මේ ගැටලුව දෙස තවත් සංවේදී කෝණයකින් බලන පස්සර දෙමළ ජාතික පාසලේ විදුහල්පති ජී. අරුමුගම් මහතා මෙසේ කියයි. ඔහු කතා කරන්නේ තම අත්දැකීම් ඇසුරෙනි.




> **විලාසම ලෙස නම් කරන ලද මෙම වැඩසටහනෙහි අරමුණ වූයේ පුද්ගලයකුට ලිපිනයක් ලබාදීම පමණක් නොවේ. ඒ සමග මනුෂ්‍යත්වයට හිමි අභිමානය හා ගරුත්වය ලබාදීම ද මේ වැඩසටහනෙහි අරමුණක් විය.**

"ළමයින් විශ්ව විද්‍යාලයට තෝරාගැනීම සඳහා ලිපි එනවා. රැකියා සඳහා හෝ විද්‍යා පීඨ සම්මුඛ පරීක්ෂණ ආදි ඒවාට ලිපි එනවා. මේ සඳහා ළමයින්ට ලිපි එන්නේ අනෙක් අයට වඩා පරක්කු වෙලා. මේවා වත්තේ කාර්යාලයට පියුන් කෙනෙක් ගිහිල්ල අරං එනවා. පස්සේ කාගේ අතේ හරි දීලා යවනවා. මම වත්තේ ඉන්න කාලෙත් ඒ වගේ තමයි. මම දන්න තරමින් ඒ ක්‍රමය තාමත් වෙනස් වෙලා නැහැ කියලයි මම හිතන්නෙ. එකක් තමයි වෙලාවට ලැබෙන්නැති එක, සමහර ළමයි එනවා, "සර් හෙට උදේ ඉන්ටර්විව් එකක් තියෙනවා සහතික ඕනෙ කියලා" මෑතකදි මම මාසයක් හිටියේ නැහැ. මං ආවට පස්සේ ඊළඟ දවසෙ ළමයි තිදෙනෙක් ආවා, වවුනියාවේ සඳුදා උදේ සම්මුඛ පරීක්ෂණය, ඉරිදා මෙහෙං යන්න ඕන සෙනසුරාදා හවස තමයි ලියුම් හම්බ වුණේ කියලා සෙනසුරාදා රෑ ඇවිල්ල මගෙන් සහතික ඉල්ලනවා. ඉතිං මම ක්වාටස් එකේ ඉන්න නිසා සෙනසුරාදා රෑ ඇවිල්ලා, ඒ ගොල්ලන්ට අවශ්‍ය දේවල් ලබා දීලා ඉන් පසුව ඒ ගොල්ලන් ඉරිදා ගිහින් සඳුදා සම්මුඛ සාකච්ඡාවට ගියා."

මඩොල්සිම පොලිස් ස්ථානාධිපතිවරයාගේ අත්දැකීම් මෙසේ ය.

"දවසක් පැමිණිල්ලක් ආවා. ඒක විභාග කරනකොට රාජේන්ද්‍රන්ගේ නෝනා ඇවිල්ල පැමිණිල්ලක් දානවා සිවලිංගම් ගැහුවයි කියලා, පස්සෙ ඒක විභාග කරන කොට, රාජේන්ද්‍රනුයි, එයාගේ නෝනයි, සිවලිංගමුයි ඇවිල්ල සාමදාන වුණා. පස්සෙ බලන කොට මොකද්ද වෙලා තියෙන්නෙ. පැමිණිල්ල දාපු පැමිණිලිකාරයගේ නමත් එකයි. ගහපු එක්කෙනාගේ නෝනගේ නමත් එකයි. ඉතිං මගේ මහත්තයා තමයි මේ කියලා, පොලිසියට ඇවිත් සාමදාන වුණා. පස්සෙ පැමිණිල්ල දාපු එක්කෙනා ඇවිත් අපෙන් අහනවා මම නැතුව කොහොම ද ඕගොල්ලං සාමදාන වුණේ. පැමිණිල්ලක් කොහොම ද එහේම විභාග කරන්නෙ කවුරුත් නැතුව එහෙම ඇයි කළේ සර් කියලා. පස්සෙ ආයෙත් වග උත්තර කාරයත්තෙක්කම ගිහිල්ල පැමිණිලිකාරයා හොයාගෙන ඇවිල්ල පැමිණිලි විභාග කරන්න වුණා. ඔන්න ඔය වගේ ගොඩාක් සිද්ධීන් වලට මුහුණ දෙන්න වෙනවා.

ඔය වගේ පසුගිය දිනක මම වතුකරයේ එක්කෙනෙකුට පැමිණිලිකාරයෙකුට පණිවිඩයක් යැව්වා එන්න කියලා. ඊට පස්සෙ ඒ පොලීසියෙන් මට කියල තිබුණා මේ නම තියෙන තුන්දෙනෙක් ඉන්නවා. ඒ තුන්දෙනාම බැඳලා ඉන්නෙ කියලා. එතකොට මේ ගැහැණු එක්කෙනාගේ ස්වාමි පුරුෂයා කවුද? උඩ කොටසේ රාජේන්ද්‍රන් කියනවා. උඩ කොටස කිව්වාම උඩ කොටසේ සෑහෙන පිරිස් ඉන්නවා. ඒක හොයාගෙන යනකොට රාජේන්ද්‍රන්ලා හතර පස් දෙනෙක් ඉන්නවා. එතකොට අර මනුෂ්‍යයා හොස්පිටල් එකෙන් ටිකට් කපාගෙන එනකම් අපිට ඉන්න වෙනවා, පැමිණිල්ලක් විභාග කරන්න හෝ අත් අඩංගුවට ගන්න හරි, මොකද එතකම් අපිට රාජකාරියේ විමර්ශන ඉවර කරන්න බැහැ."

මතුපිටින් බලන විට පුද්ගලයකුගේ ලිපිනය ඉතා සරල දෙයක් ලෙස පෙනුන ද මිනිසකුගේ ජීවිතයට එහි ඇති සංකීර්ණ සම්බන්ධය කොතරම්දැයි ඉහත අත්දැකීම් මගින් පැහැදිලි වේ. මෙතරම් සංකීර්ණ ගැටලුවකට විසඳුම් සෙවීම සඳහා වගකිවයුත්තන්ගේ අවධානය බරපතල ගැටලුවක් වන්නේ එබැවිනි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය මගින් මේ ගැටලුවට විසඳුමක් සෙවීමට ඉදිරිපත් වූයේ ඉහත පසුබිම යටතේ ය. එහි දී ඔවුහු තම හවුල්කාර සංවිධානයක් වන ඌව ශක්ති පදනම සමග එක්ව මේ සඳහා විසඳුම් සපයන නියමු ව්‍යාපෘතියක් සැලසුම් කළහ. එම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූවේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි පස්සර ප්‍රදේශය ආශ්‍රිතව ය.

පස්සර ප්‍රාදේශීය සභාව, පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පස්සර ප්‍රදේශයේ අදාළ කොට්ඨාශවල ග්‍රාම නිලධාරීවරුන් සහ පස්සර පොලිසිය ඇතුළු ආයතන රැසක සහභාගිත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේ ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහයෙනි.

විලාසම ලෙස නම් කරන ලද මෙම වැඩසටහනෙහි අරමුණ වූයේ පුද්ගලයකුට ලිපිනයක් ලබාදීම පමණක් නොවේ. ඒ සමග මනුෂ්‍යත්වයට හිමි අභිමානය හා ගරුත්වය ලබාදීම ද මේ වැඩසටහනෙහි අරමුණක් විය.

2013 වසරේ අවසාන මාස හයක කාලය තුළ ක්‍රියාත්මක වූ මේ වැඩසටහන මගින් පවුල් 3000කට පමණ ස්ථිර ලිපිනයන් ලබාදීමට හැකි විය. මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කෙරුණු වෙනත් කටයුතු සමහරක් වූවේ ලිපි ලේඛන බෙදා හැරීම, සුරක්ෂිත කරනු වස් ප්‍රදේශ 20ක ආරක්ෂිත තැපැල් ලිපි එකතු කිරීමේ පෙට්ටි ස්ථාපිත කිරීම, ප්‍රදේශයේ වතුවල අතුරු මාර්ග 40ක් සඳහා සුදුසු නම් සාකච්ඡා කොට තෝරාගෙන නාම පුවරු සවිකිරීම යනාදියයි. ජාතික හැඳුනුම්පත් 300ක් සඳහා ඉල්ලුම්පත් යැවීමේ ක්‍රියාදාමය කඩිනම් කිරීම පිණිස ජංගම කාර්ය සායනයක් පැවැත්වීම ද මේ යටතේ සිදුවිය.

මේ අනුව විලාසම ව්‍යාපෘතිය මගින් ස්වභාෂා අයිතිය හැරුණු විට ඉන් ඔබ්බට ගිය වතු ජනයගේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ගැනිය හැකි තොරතුරු හුවමාරුවටත්, තමන්ටම අනන්‍ය වූ ලිපිනයකටත්, දිනාගත් අයිතීන් හා හිමිවිය යුතු වරප්‍රසාද, ජයග්‍රහණ ඇතුළු මානව උරුමයන් රැකගැනීමටත් පිටුබලයක් ලැබෙනු ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බදුල්ල දිස්ත්‍රික්කය තුළ මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී එහි ප්‍රධාන හවුල්කාර සංවිධානය වූ ඌව ශක්ති පදනම වෙනුවෙන් එහි සභාපති නඩේසන් සුරේෂ් මහතා තම සාමූහික ක්‍රියාකාරිත්වයෙහි ගමන් මග හා අනාගතය පිළිබඳ දැක්වූ අදහස් මෙසේ ය.

"මේ රටේ විවිධාකාර මානව සංවර්ධන ගැන කතා කරනවා, විශේෂයෙන් මානව හිමිකම් ගැන කතා කරනවා. නමුත් අපට තවමත් බැරිවුණා මිනිසෙකුගේ අනන්‍යතාවය පිළිබඳ යම්කිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න. මං හිතන්නෙ අවුරුදු 100ක් පැරණි මෙම වාසස්ථානවල ජීවත්වන මෙම සහෝදර ජනතාව, ඒ ගොල්ලන්ට මේ හඳුනාගත් ගැටලු විසඳීම උදෙසා යම්කිසි ප්‍රයත්නයක් දරනවා. ඒ ප්‍රයත්නය තමයි මේ හැම නිවසකටම, ඔය ලයිම් කාමර කියන වචනෙ වෙනස් කරල, ඒගොල්ලන්ට නිදහසේ ජීවත්වෙන්න, තවත් කෙනෙකුට ගෞරව කළහැකි නිවසක් හැටියට ඒ නිවසට නමක්, ඒ නිවසට අංකයක්, ඒ වගේම ගෞරවානුකූලව ලිපිනයක් ලැබිලා, ඒ අයගේ නිවසටම ලිපිනයක් ලැබෙනකොට කොයිතරම් සතුටක් ද ඇති වෙන්නෙ. ඉතිං මේ තුළින් ඒ අයගේ අනන්‍යතාවය ගෞරවානුකූලව රැකගැනීමේ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කළා. ඒ වගේම ලිපිනයන් ලබාදෙන මෙම වැඩසටහන තුළ අපි බලාපොරොත්තු වෙන්නෙ විශේෂයෙන් ප්‍රාදේශීය දේශපාලන අංශ ඒ වාගේම ප්‍රාදේශීය රාජ්‍ය සේවය සපයන ආයතන ඒ ආයතන සමග මනා සම්බන්ධතාවය ගොඩනගමින් විශේෂයෙන් පොලීසිය, තැපැල් කාර්යාලය ඒ වගේම වතු අධිකාරිය, ග්‍රාම සේවක නිලධාරීන්, සිවිල් සංවිධාන මේ සියලු දෙනාම එකතු වෙලා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. මං හිතනවා මේ වැඩසටහන තුළින් වතුකරයේ යම්කිසි වෙනසක් ඒ වගේම මේ අයගේ ගෞරවය, විශ්වාසය ගොඩනගාගෙන බහුතර ජනතාව සමග සතුටින් සමගියෙන් ජීවත් වීමට මුලපිරීමේ අවස්ථාව ලැබේයැයි අපි බලාපොරොත්තු වෙනවා."

ලයනල් ගුරුගේ මහතා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු ලෙස කටයුතු කරන අතර මේ දිනවල ද්විභාෂා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් උතුරු හා නැගෙනහිර පලාත්වල ක්‍රියාත්මක කරමින් සිටී. එම ව්‍යාපෘතියේ නවතම අදියර මගින් උතුරු හා නැගෙනහිර පළාත්වලට අදාළව භාෂා විගණනයක් සිදු කෙරෙන අතර එහි මූලික අරමුණ වන්නේ මෙකී ප්‍රදේශවල භාෂා ප්‍රතිපත්තිය කවර මට්ටමකින් ක්‍රියාවට නැගී තිබේදැයි වටහා ගැනීම ය. එම අත්දැකීම් මත පදනම්ව ගුරුගේ මහතා සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් මෙම ලිපිය සකස් කර ඇත.

# ශ්‍රී ලංකාවේ භාෂා සමානතාව ප්‍රවර්ධනයේ අවශ්‍යතාවය



**පසුබිම**

ඓතිහාසිකව බලන කල භාෂාමය ගැටලු විසින් මේ රට භේදභින්න කරන ලදැයි කීම අතිශයෝක්තියක් නොවේ. ඒ කෙසේ වෙතත් පසුගිය දශක තුනක කාලසීමාව තුළ ක්‍රමයෙන්, ප්‍රතිපත්ති සම්පාදකයන් හා අනෙකුත් අදාළ පාර්ශව ශ්‍රී ලංකාවේ භාෂා සමානතාව සහතික කිරීමේ වැදගත්කම අවබෝධ කරගනිමින් සිටින බව පෙනෙයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(ආ) වගන්තිය සහ එහිම 13 වන සංශෝධනය මගින් භාෂා සමානාත්මතාවයෙහිලා පවතින අයිතිය පිළිගෙන ඇත.ඊට සමගාමීව, 2009 පෙබරවාරි මස 03 වැනි දින ගන්නා ලද කැබිනට් තීරණය හා 2009 සැප් 25 වැනි දින ප්‍රකාශිත අංක 1620/27 දරණ ගැසට් නිවේදනය මගින්ද ප්‍රකාශිත පරිදි සියළු රාජ්‍ය ආයතන ද්විභාෂා ප්‍රතිපත්තියට අනුගතව තම රාජකාරී කටයුතු පවත්වාගෙන යා යුතු අතරම අදාළ සියලු ලිපි ලේඛන ද භාෂා දෙකෙන්ම (සිංහල හා දෙමළ)ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කිරීම අනිවාර්ය වී තිබේ.

මෙහි දී තවත් සිහිපත් කළ යුතු කරුණක් වන්නේ මෑතදී ප්‍රකාශයට පත් කරන ලද LLRC වාර්තාවයි. ඒ සඳහා එමගින් භාෂා විෂය සම්බන්ධයෙන්ද සැලකිය යුතු මට්ටමේ ප්‍රශස්ත කරුණු සමුදායක් ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා සැලකිය යුතු ප්‍රසිද්ධියක් ද ලබා දී තිබිණි. එහෙත් මේ වන විට ඒවා ද පසෙකට දමා ඇත.

බලයේ සිටින දේශපාලන පක්ෂ හා රාජ්‍ය නිළධාරීන්ද ඇතුළත්ව රටේ දෙපසේම සිටින ජනතාව (දකුණේ සිංහල බස පමණක් හා උතුරේ දෙමළ බස පමණක්) අඛණ්ඩව මෙම භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝණය කරමින් සිටිති. අප විසින් සිදුකරන ලද සුවිශේෂ අධ්‍යයනයක් හරහා සොයා ගන්නා ලද කරුණු අතරින් කිහිපයක් මෙහි දී ඉදිරිපත් කළ හැකි ය. මේ තොරතුරු ලබාගත්තේ ව්‍යාපෘතිය අතරතුර ක්‍රියාත්මක කළ සමීක්ෂණයකිනි.

සමහර ආයතන රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිගෙන කටයුතු කරන ආකාරය ද මෙහි දී දැකගත හැකිවිය. කෙසේ වෙතත්, විශේෂයෙන්ම දකුණේ රාජ්‍ය නිලධාරීන් රටේ වෙනත් නිල රාජ්‍ය භාෂාවක් පවතින බවක් සැලකිල්ලට ගනිමින් කටයුතු කරන බවක් පෙනෙන්නට නැත. ඔවුන් අඛණ්ඩවම මීට අදාළ නීති හා රෙගුලාසි අවඥාවට ලක් කරමින් කටයුතු කරනු ලබන අතර පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ධීවර අමාත්‍යාංශය මෙහිලා ඒ පිළිබඳව දක්වන ආකල්පය ඉතා අල්ප බවද සදහන් කළ යුතුමය. එකී ආයතන පිළිබදව සුවිශේෂී වශයෙන් සදහන් කළද මෙම ගැටලුව සෑම අමාත්‍යාංශයක් පාසාම අඩු වැඩි වශයෙන් පවතින බවද මෙහිලා සදහන් කළ යුතුය.

සැබවින්ම මෙම ගැටළුව කෙතරම් නොසැලකිල්ලට භාජනය වී ඇත්තේ ද යත්, ඔබ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ඇති නාම පුවරු පවා බොහෝ විට ඉදිරිපත් කර ඇත්තේ එක් භාෂාවකිනි. "පඩිපෙළ මත අසුන් ගැනීමෙන් වළකින්න" "විමසීම් කවුළුව" "මේ දොර තල්ලු කරන්න","නිශ්ශබ්ද වන්න", යන වදන් සියල්ලම සිංහල හෝ ඉංග්‍රිසි යන බසින් පමණක් පවතින අතර ''කෙළ ගසන්න එපා '' යන්න පවා සදහන් කොට ඇත්තේ ඉංග්‍රිසි බසින් පමණක්ය, යැයි ඇසීම සමහර විටෙක ඔබ පුදුමයට පත් කරවන හේතුවක් විය හැකිය.

මෙකී නිදසුන් හරහා අප සියලු දෙනාට නිගමනය කළ හැකි කරුණු කිහිපයක් ඇත. එකක් නම් භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීම උදෙසා වගකිවයුතු බලධාරීන් තම යුතුකම් හා කාර්යභාර්ය නිසිලෙස ඉටු නොකරන බව ය. එසේ ම ජනතාව සතුව ද අනෙකුත් ජනතාවගේ භාෂා අයිතීන් උදෙසා නිසි තැන හා අවැසි පරිසරය උදාකිරීමේ ආකල්පයෙන් කටයුතුකිරීමේ පුරුද්දක් නොමැති බව පෙනෙයි.

නීතිය පිළිබදව සලකා බැලීමේ දී මීට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන ගැසට් නිවේදන රාශියක් හා චක්‍රලේඛ මෙන්ම පනතක්ද පවතී.මේවා උල්ලංඝණය කිරීම අඛණ්ඩව පවතින පරිසරයක හා එය වැලැක්වීමට කිසිවෙක් ඉදිරිපත් නොවන්නා වූ පසුබිමක මෙය සැලකිය හැක්කේ පොදු ව්‍යාධියක් හෝ බේදවාචයක් ලෙස මිස වෙන අන් කවර ආකාරයකටද ?

**භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීම සඳහා වන රජයේ වාර්තා**

මේ සම්බන්ධව පළමු කොටම කිවයුතු කරුණක් වන්නේ,

පෙර පැවති තත්ත්වයට වඩා යම් සාධනීය මට්ටමක් අද වන විට පවත්නා බවයි.එසේ වූවත් එය පමණක්ම ප්‍රමාණවත් නොවේ. නිදසුනක් ලෙස පොලීසිය පිළිබදව සලකා බැලීමේදී "පොලිස් නිලධාරීන් බදවාගෙන ඇතැයි යන්න හා එතුළින් සියල්ල වෙනස් වේ යැයි" ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. නිදසුනක් ලෙස දක්වන්නේ නම් පොදුවේ පිළිගත් ප්‍රතිපත්තියක් භාෂා දෙකෙන්ම කටයුතු කළ යුතු වීම,ස්ථානගත වී ඇත්තේ කවර ප්‍රදේශයකදැයි යන්න නොසලකා සියලුම පොලිස් ස්ථාන වලට පොදු විය යුතුය.

මහරගම ප්‍රදේශය මීට අදාළව සලකා බලන්නේ නම් යම් පුද්ගලයෙක්, යම් ගැටලුවකට මැදි වී සිටින්නේ නම් හා එම පුද්ගලයාට පොලිස් ස්ථානයක සේවය අවශ්‍ය වන්නේනම් එසේ සහාය අවශ්‍ය වන්නේ එක් පුද්කුගලයෙකුට

වූවද එම පුද්ගලයාට තම මවුබසින් අදාල පොලීසිය හා කටයුතු කිරීමේ හැකියාවක් පැවතිය යුතුය. ඔබ පොලීසියකට ගොස් හාත්පස බලන විටෙක ඔබ හට පෙනී යන්නේ "අපරාධ අංශය" "සුළු පැමිණිලි", මෙන්ම ඔබ ඉදිරිපත් කරන පැමිණිල්ලක පිටපත් ලබා ගන්නා "චෝදනාගාරය" යන්න පවා ලියා ඇත්තේ එක් බසකින් පමණක් නම් මෙකී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමේ දී කොතැනක හෝ බරපතල වැරැද්දක් වී ඇති බව පිළිගැනීමට සිදුවේ. එපමණක් නොව "රථවාහන අංශය" ඇතුළුව තවත් පොලීසිය සතු විවිධ අංශ පිළිබඳව සදහන් කර ඇති නාම පුවරු එක් බසකින් පමණක් නිර්මාණය කර ඇති අතර ත්‍රෛභාෂාවෙන් නොව ද්වි භාෂාවෙන් පවා එම පුවරු සකස් කර නොමැති බව ඉතා පහසුවෙන් නිරීක්ෂණය කළ හැකිය.

නිවේදන, අපරාධ පරීක්ෂණ, පැමිණිලි ආදිය ඒවා පමණක් නොව ඒ හා සමගාමීව සෑම කරුණකටම අදාළ තොරතුරු බොහෝ දුරට සිංහල බසින් පමණක් දක්නට ඇති අතර ඉංග්‍රිසි බසින්ද සමහර අවස්ථාවල දක්නට ලැබේ. වැඩි වැඩියෙන් පුද්ගලයන් බදවා ගනිමින් සිටින්නේය යන්නට අමතරව ශ්‍රී ලංකා පොලීසිය සේම හමුදාව තුළද භාෂා අංශයෙන් සාමාන්‍ය ජනතාවට දැනෙන සුළු වෙනසක් වහා සිදු කළ යුතු ය. භාෂා අයිතිවාසිකම් කෙරෙහි තමන් සැලකිලිමත්ය යන්න විද්‍යාමාන කිරීමට එවැනි ක්‍රියා මාර්ග ඉතා වැදගත්ය.(මෙවැන්නක් සිදු වී නැත්තා සේම එවැනි පරිසරයක් නිර්මාණය වන පසුබිමක්ද දැකිය නොහැක.)

යටත් පිරිසෙන් යමෙකුට පහසුවෙන් කියවිය හැකි වන සේ නාම පුවරු හෝ භාෂා තුනෙන්ම නිර්මාණය කළ යුතු වීම අනිවාර්ය අංගයක් වී ඇත.

එමෙන්ම මෙහිලා  අවධාරණය කළ යුතු කරුණක් වන්නේ මෙය හුදු ප්‍රදේශයේ ජනගහණය හෝ භාෂාව භාවිතා කරන ජනගහන ප්‍රතිශතය පිළිබඳව පමණක් මෙහි දී සලකා තීරණ ගත යුතු කරුණක් නොවන බව ය.

රට තුළ නිල රාජ්‍ය භාෂා දෙකක් පවතින අතර එකී ප්‍රතිපත්තිය රටෙහි කවර තැන වූවද එක ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය වී තිබිය යුතුය. එවන් පරිසරයක් කිසිලෙසකින් හෝ අප රට තුළ දක්නට නොමැත. පොලිසියට අදාළ සිද්ධීන් පිළිබදව වන කරුණු සලකා බැලීමේ දී ඉදිරිපත් කළ හැකි ඉතා පැහැදිළි නිදසුනක් වන්නේ මඩකලපුවේ දී ගුරුබරන් මහතාට අදාළ සිද්ධිය පාදක කර ගනිමින් ඉදිරිපත් කළ නඩුකරය හා ඒ හා සමාන අනෙකුත් නඩුකර කීපයයි.

1. පොලිස් ස්ථානයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ නිලධාරියා ලබා දුන් පිළිතුරට අනුව ඔවුන් හට දෙමළ බසින් රාජකාරී කිරීමට උපදෙස් ලැබී නොතිබුනු බැවින් යාපනය විශ්වවිද්‍යාලයේ කතිකාචාර්යවරයෙක් වූ ගුරුබරන් මහතා දැක්වූ පරිදි ස්ථානීය දඩවලට අදාළ නිවේදනයේ දෙමළ පරිවර්තනයක් ලබා දීම අවශ්‍ය නැත යන සිද්ධිය නඩුකරයට පාදක විය.

මේ වන විට මවිසින් මානව හිමිකම් කොමිසම වෙත සිද්ධීන් 20 ක් පමණ ඉදිරිපත් කර ඇති අතර එකදු දෙමළ කථා කළ හැකි නිළධාරියෙක් හෝ නොමැති පොලිස් ස්ථාන රාශියක් මන්නාරම දිසිත්‍රික්කයේ පැවතීම ඊට අදාළ එක් නිදසුනකි.

පුහුණුව ලත් සමහර නිළධාරීන් සැබවින්ම ඔවුන්ට අවශ්‍ය වන්නා වු ප්‍රදේශ වෙත අනුයුක්ත කොට නොමැත.

පොලීසියට අදාළව පවත්නා කරුණු පසෙකින් තැබුවද, ද්විභාෂාවෙන් හෝ ත්‍රෛභාෂාවෙන් කටයුතු කළ යැයි සැලකෙන සියලුම ආයතන තුළ ප්‍රායෝගිකව එවැන්නක් නොපවතින්නක් මෙන්ම එවැනි සූදානමක් පවා දක්නට නැත.

ඉතා සරල නිදසුනක් දක්වන්නේ නම් "ඉඩම් කාර්ය සංග්‍රහයේ ද" දෙමළ පරිවර්තනයක් නොමැති වීම දැක්විය හැකිය. ඔබ එසේ පරිවර්තනය කර නැත්තේ ඇයි දැයි විමසන විටෙක ඔවුන් පවසන කරුණ වන්නේ එය පරිවර්තනය සඳහා අවශ්‍ය අරමුදල් ඔවුන් සතුව නොමැති බවයි. මේවා ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය ලිපිලේඛන බව මෙහිලා නොකිවමනාය. ඔබ රෝහලකට යන්නේ නම් එහි නාම පුවරු ඇත්තේ සිංහල බසින් පමණි.

මීට අදාළ ගැටලු නිරතුරුවම දැකිය හැකිය. නවිපිල්ලේ මෙහිදී ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරයෙන් අනතුරුව මෙරටේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය පිළිබඳ ඇය සතුටට පත්වන බවත් දක්වා තිබූ අතර අද පවත්නා සැබෑ තත්වය අභියස ඇයට සතුටුවිය හැකි ද යන්න ගැටලු සහගතය. සමහර විට අදාළ බලධාරීන් ඇයට පෙන්වන්නට ඇත්තේ තෝරාගත් සුබවාදී කරුණු කිහිපයක් පමණක් විය හැකිය. එහිලා යම් ප්‍රගතියක් ඇත යන කරුණු මෙහිදී බැහැර නොකරන බවද සිහිකළ යුතුය.

භාෂා පංති, පුහුණු කිරීම්, පරිවර්තන ආදිය එහිලා නැත්තේ නොවේ නමුත් මෙහී මැදිහත්වීම් ක්‍රියාවට ගැනෙන්නේ ඉතා මන්දගාමී අයුරින් වන අතර උද්ගතවී ඇති ගැටලුවලට සරිලන ආකාරයට එවැනි දේ ක්‍රියාවට ගැනෙන බවක් පෙනෙන්නට නැත. අපගේ අත්දැකීම් අනුව පැවැසිය හැක්කේ 10% ක පමණ ප්‍රගතියක් දැකිය හැකි අතර 90% ක පමණ ප්‍රමාණයක කටයුතු ද තවමත් සම්පූර්ණ කිරීමට ඇත යන්නයි.

භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගී ඇති ආකාරය නිසිලෙස අධ්‍යයනය කිරීමට දීප ව්‍යාප්ත භාෂා විගණනයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

සියලු රාජ්‍ය ආයතන, සියලු පෞද්ගලික ව්‍යාපාර, සියලු පොදු භූමි, ආදිය විගනණයට ලක්කළ යුතු අතර භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ නිවැරදි නිගමනයකට අපට එළඹිය හැක්කේ එවැන්නක් සිදුකිරීමෙන් අනතුරුව පමණි.

මේ මොහොත වන විට (අපගේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස) අප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක නියාමක වැඩසටහනක් හරහා ඒ සඳහා කටයුතු කරමින් සිටින අතර මෙම මූලික වෑයම අනෙකුත් ප්‍රදේශ කරාද ව්‍යාප්ත කිරීමේ හැකියාවක් පවති.

**නිර්දේශ**

1. රාජ්‍ය භාෂා කොමිසම සතු බලතල පුළුල් කිරීම

භාෂා ප්‍රවර්ධනයේ දී ඉතා වැදගත් වන්නා වූ මානව හිමිකම් කොමිසම් සහ රාජ්‍ය භාෂා කොමිසම යන ආයතන දෙකම දැනට ඔවුන්ගේ බලය (අධිකාරිය) නිසිලෙස භාවිතා නොකරන/භාවිතා කළ නොහැකිව තත්ත්වයක සිටින බව පෙනේ. එම ආයතන ක්‍රියාත්මක වීමට අවශ්‍ය ප්‍රමාණවත් මිනිස් බලය හා ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් සමග පුළුල් පරාසයක ක්‍රියාත්මක වීමේ බලය ලබා දිය යුතුව ඇත. රාජ්‍ය භාෂා කොමිසමෙහි බලය/බලපෑම සහ ඊට ළඟා වීම ප්‍රමාණවත් නොවේ, නියෝග නිකුත් කිරීමේ බලය, භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමේ බලය හා එහි නීතිමය බලය වඩාත් ශක්තිමත් කළ යුතු ය. දැනට කොළඹ කේන්ද්‍රීය ආයතනයක් බවට පත්ව ඇති තත්වය තුළ දිස්ත්‍රික් මට්ටමේ කාර්යාල පිහිටුවීටම ද නිර්දේශ කළ හැකිය. ඊට හේතුව,

එහි අවධානය වඩාත් අවශ්‍ය කරනුයේ කොළඹට වඩා කොළඹින් බැහැර පළාත් වලට බැවිනි. දැනට රාජ්‍ය ආයතන, රාජ්‍ය භාෂා කොමිසම නිසි ලෙස පිළි නොගන්නා තත්ත්වයක් නිර්මාණය වී ඇත.

LLRC කොමිසම, විවිධාකාර කොමිෂන් සභා පිහිටුවාලීමට යෝජනා කළද ඒවා සතුව බලයක් නොමැත්තේ නම් එසේ පිහිටුවීම නිෂ්ඵල කාර්යයකි.

2. ද්වි භාෂා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුළුල් කිරීම : කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක සිංහලහෝ දෙමළෙන් ද්විභාෂික ජනගහන ප්‍රතිශතය අවම 3%ක් වන විට එම කොට්ඨාශය ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ලෙස නම් කළ යුතු ය.

දීප ව්‍යාප්ත මට්ටමේ පුළුල් භාෂා විගණනයක්  සේම, එම කෙටිකාලීන හා දීර්ඝ කාලීන විසදුම් සදහා අවශ්‍ය වූ නිර්දේශ සදහා එවැන්නක් උපයෝගී වේ. රාජ්‍ය ආයතන විගණනයකට

**භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගී ඇති ආකාරය නිසිලෙස අධ්‍යයනය කිරීමට දීප ව්‍යාප්ත භාෂා විගණනයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.**

ලක්විය යුතු ය. එවැන්නක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අරඹන අතර තුර අදාළ ක්‍රියාවලිය ස්ථාපිත කිරීමෙහිලා අවශ්‍ය සාකච්ඡා හා ප්‍රායෝගික සැලසුම් අවශ්‍ය කෙරේ. සැබෑ තත්ත්වය පිළිබඳ යථාර්ථවාදී දැක්මක් ළඟා කර ගත හැක්කේ එවැනි ක්‍රියාමාර්ගයක් හරහා පමණි.

4. අධ්‍යාපන ප්‍රතිපත්ති/නිර්දේශ වලට අතිරේක

6 වැනි ශ්‍රේණියේ සිට 11 දක්වා (සාමාන්‍ය පෙළ) සිසුන් සදහා අයිතීන්ට අදාළ භාෂා විෂයය යටතේ ප්‍රශ්න පත්‍රයක් හඳුන්වා දිය යුතු ය. ළමුන්ගේ ක්‍රමානුකූල දැනුම තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ගැසට් නිවේදන මඟින් භාෂාවට ලබා දී ඇති පිළිගැනීම මෙන්ම චක්‍රලේඛ, නීති හා රෙගුලාසි ඇතුළුව යටත් පිරිසෙන් අදාළ පරම්පරාව පෙර මෙන් වටිනාකම අවබෝධ කරනු ඇත.

මෙකී ක්‍රියාමාර්ග හරහා ආකල්පමය වෙනසක් සිදු කළ හැකි වන ආකාරයට මෙන්ම හැකිතාක් තමන්ගේම භාෂාව ඉගෙනීම තුළ ඊළඟ පරම්පරාව එකිනෙකාගේ භාෂාවලට ගරු කරන සුළු පරිසරයක් නිර්මාණය කිරීමට ද හැකි වනු ඇත.

5. භාෂා ගුරුවරුන් හට සහාය දීම

ඉංග්‍රිසි ගුරුවරුන් හරහා ගුරු අභ්‍යාස විද්‍යාල පවතින බැවින් සිංහල හා දෙමළ යන භාෂා වලින් උගන් වන ගුරුවරුන් සදහා දෙමළ හා සිංහල ගුරුවරුන් සදහා ද ගුරු අභ්‍යාස විද්‍යාල ඇති කළ යුතුය.

6. භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීම සදහා වූ මාධ්‍ය හා සබැදි උපාය මාර්ගයන්

ජනතාව අතර භාෂා අයිතීන් පිළිබදව දැනුම්වත් කිරීමේ දී මාධ්‍ය සතුව ඉතා වටිනා භූමිකාවක් ඇත. සමාජ සංහිඳියාව  වගාකිරීමෙහිලා ද මාධ්‍ය සතු භූමිකාව අනල්පය. සිංහල ප්‍රේක්ෂකයන්හට දෙමළ ප්‍රේක්ෂකයන් වෙත ළඟා වීම සදහා දේශීය මට්ටමින් යම් ක්‍රමවේදයක් පැවතිය යුතු ය. අඛණ්ඩව ඉන්දීය නාලිකා හරහා පෝෂණය වෙමින් සිටීමට වඩා එවැන්නක් ඉතා ඵලදායී වේ .

මෙය ඉතා සුපරීක්ෂාකාරීව විග්‍රහ කරගතයුතු අතරම අවධානයද ලක් කළ යුත්තකි.

# භාෂා අයිතිය තහවුරු කරමින් ගමින් ගමට...

සුළුතර ජාතිකත්ව ප්‍රජාවන්හි භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනෙහි අදියර තුනක් මේ වන විට සාර්ථකව නිම වී ඇත. මෙම වැඩසටහන් මගින් මෙරට භාෂා අයිතීන් ප්‍රවර්ධනය හා තහවුරු කිරීම සඳහා විවිධ මුහුණුවරින් යුතු වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක විය.

රාජ්‍ය නිලධාරීන් හා පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන්වල සිට වගකිවයුතු රාජ්‍ය ආයතන හා වෙනත් බලවේගයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම දක්වා පුළුල් පරාසයක එම වැඩසටහන් පැතිර තිබිණි.

භාෂා සංගම් ගොඩනැගීම, සිවිල් සංවිධාන ගොඩනැගීම, භාෂා අයිතීන් කඩවීම පිළිබඳ තොරතුරු ගවේෂණය, එවැනි සිදුවීම් පිළිබඳ තොරතුරු ජනමාධ්‍ය මගින් හෙළිදරව් කිරීම මෙම ක්‍රියාකාරිත්වයන් සඳහා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම, ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සමග සබඳතා ගොඩනැගීම භාෂා අයිතීන් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, වීදි නාම පුවරු හා ආයතන නාම පුවරු ඉදිකිරීම යන වැඩසටහන් මෙයින් ප්‍රධාන විය.

ඒ අතරින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මගින් එම සංකල්පය ගමට ගෙනයාමේ වැඩපිළිවෙළ වඩා ශක්තිමත් විය. ගම් මට්ටමේ දැනුවත්වීම වේගවත් වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

විශේෂයෙන් භාෂා අයිතීන් කඩවීම් පිළිබඳ රාජ්‍ය භාෂා කොමිසම හා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් වීම පුළුල් වීමට හේතුවක් වූයේ ද එම දැනුවත් කිරීමේ වැඩසටහන් ය.

පහත දැක්වෙන්නේ පසුගිය දින කිහිපය තුළ ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ එබඳු වැඩසටහන් කිහිපයක් විභාෂා කැමරා ඇසට හසු වූ ආකාරයයි.




පෙබ. 6 වැනිදා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රාජ්‍ය නිලධාරීන් හා භාෂා සංගම් නිලධාරීන් සඳහා පැවති වැඩමුළුව






පෙබ. 8 වැනිදා මොනරාගල සණස සංවර්ධන ශ්‍රවණාගාරයේ දී රාජ්‍ය නිලධාරීන් හා භාෂා සංගම් නිලධාරීන් සඳහා පැවති භාෂා පුහුණු වැඩමුළුව




පසුගිය පෙබ. 7 වැනි දා සවස් වරුවේ සෙංකඩගල පුරවරයේ කැන්ඩි සිටි මිෂන් ශාලාවේ භාෂා සංගම් නිලධාරීන් සඳහා පැවති භාෂාව හා නීතිය සම්බන්ධ වැඩමුළුව




හැටන් (දික්ඔය) ප්‍රදේශයේ පෙබ. 07 වැනිදා පැවති රාජ්‍ය නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩමුළුව





පෙබරවාරි 6 වැනි දින අඹන්ගඟ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රාජ්‍ය නිලධාරීන් සඳහා පැවති වැඩමුළුව




පෙබ. 8 වැනිදා පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී රාජ්‍ය නිලධාරීන් හා භාෂා සංගම් නිලධාරීන් සඳහා පැවති භාෂා පුහුණු වැඩමුළුව

**ශ්‍රී ලංකාවේ ද්විභාෂා අයිතීන් පිළිබඳව මෙරට ජනමාධ්‍ය ක්‍රියා කරන ආකාරය හා ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීමට ජනමාධ්‍යය කටයුතු කරන ආකාරය පිළිබඳව සංවාදයක් ගොඩනැගීමට අපි උත්සාහ කළෙමු. ඒ සඳහා අදහස් ලබාගැනීම සඳහා අප යොමු වූයේ මෙරට භාෂා අයිතීන් පිළිබඳ උනන්දුවක් සහිත ජනමාධ්‍යවේදීන්, කලාකරුවන් හා දේශපාලනඥයන් ඇතුළු ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සමාජ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු වෙත ය. එම අදහස් කිහිපයක් මෙහි පළ වේ.**

# ජනමාධ්‍ය භාෂා අයිතියේ ප්‍රධාන මෙවලමක්



## ජනමාධ්‍යවේදී නිලාර් එන්. කාසිම්

භාෂා අයිතීන් පිළිබඳ සංවේදීතාවයකින් කටයුතු කරන ජනමාධ්‍ය භාවිතියක් අද අපට දකින්නට නැති තරම්. එවැනි හැඟීමක් ඇතිව කටයුතු කරන මාධ්‍යවේදීන් අපට ඉන්නේ ඉතාම සුළු ප්‍රමාණයක්.

බොහෝ ජනමාධ්‍යවේදීන්ට සහ ජනමාධ්‍ය ආයතනවලට භාෂා අයිතීන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබීම ඊට හේතුව යැයි මම සිතනවා. එවැනි දැනුමක් හා අවබෝධයක් තිබෙන අය මේ පිළිබඳ මනා කැපවීමකින් කටයුතු කරන බවක් දක්නට ලැබෙනවා. එහෙත් ඒ ඉතාම සුළු ප්‍රමාණයක්.

භාෂා අයිතිය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමත්, ඔවුන්ගේ අයිතීන් තහවුරු කර ගැනීමටත් උපකාර කළ හැකි ප්‍රධානතම මෙවලම ජනමාධ්‍යය බව කිව හැකියි. සාමාන්‍ය ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමට ජනමාධ්‍යයට තීරණාත්මක මෙහෙවරක් ඉටු කළ හැකියි.

ඒ යටතේ විවිධ අණ පනත්, චක්‍රලේඛ මගින් ප්‍රකාශිත කරුණු කාරණා සහ ඒවාහි ඇතුළත් වී තිබෙන අයිතීන් සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම ජනමාධ්‍ය සතු ප්‍රධාන වගකීමක්. භාෂා අයිතීන් පිළිබඳ සමාජය දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය යොදාගනු ලබන අවස්ථා තිබෙන්නේ ඉතා ස්වල්පයයි.

මෙහි දී අපගේ අවධානයට ලක්විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ශ්‍රී ලංකාව යනු භාෂා සංස්කෘතික හා ආගමික විවිධත්වයෙන් පොහොසත් රටක්. එම විවිධත්වය පිළිබඳව රාජ්‍ය මට්ටමින්, පෞද්ගලික මට්ටමින් ජනතාව, ආයතන දැනුවත් කර, සියලු වැසියාට පුළුල් අවබෝධයක් ලබාදීම සඳහා ජනමාධ්‍යයට කළ හැකි මෙහෙවර විශාලයි.

අපේ රටේ විකෘති කළ ඉතිහාසය හා අයථා සන්නිවේදනය විසින් වසර 30ක් පුරා ඇදුණු යුද්ධයකට අප ඇද දමා තිබුණා. මේ වන විට ඒ සියල්ල පසෙක ලා සියලු ජනයා සහෝදරත්වයෙන්, සහජීවනයෙන් ජීවත් වීමට වෙර දරනවා. වගකිවයුත්තන් විවෘත මනසකින් යුතුව යහපත් සමාජයක් ඇති කිරීම ප්‍රධාන අරමුණ ලෙස සලකමින් ජාතික සමගිය සඳහා කටයුතු කරන්නේ නම් බොහෝ ගැටළු විසඳාගත හැකි බව මගේ අදහසයි.

කලාකරුවන්ට, ලේඛකයන්ට හා ජනමාධ්‍යවේදීන්ට මෙම අර්බුදය හමුවේ කළ හැකි බොහෝ දේ තිබෙනවා.

සිංහල ජනතාවට දෙමළ භාෂාවත්, දෙමළ ජනතාවට සිංහල භාෂාවත්, ඔවුනොවුන්ගේ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයත් ලබාදීමට දිරි ගැන්විය යුතුයි. ඒ පිළිබඳ සංවේදීතාවයකින් යුතුව කටයුතු කිරීම මෙරට ජනමාධ්‍ය සතු වගකීමක්, යුතුකමක් බවත් අවධාරණය කිරීමට කැමතියි.

---

# අද දවසේ ජනමාධ්‍ය භාවිතය හා භාෂා අයිතිය

### ගැඹුරු හැදෑරීමක් සහිත මාධ්‍ය භාවිතයක් අවශ්‍යයි



## ප්‍රවීණ ලේඛක කමල් පෙරේරා

සමාජය දැනුවත් කිරීමේ දී මාධ්‍ය විසින් කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස මා දකින්නේ රටේ භාවිතා වන ප්‍රධාන භාෂා වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඉගෙන ගැනීමේ වැදගත්කම සමාජයට වටහා දීමයි. සිංහල ජනතාව දෙමළත්, දෙමළ හා මුස්ලිම් ජනයා සිංහලත් සියලුම ශ්‍රී ලාංකිකයන් ඉංග්‍රීසි බසත් පිළිබඳව දැනුවත් නම් ශ්‍රී ලාංකික සමාජය ශ්‍රී ලාංකික ජාතියක් ලෙස සිතීමට පෙළඹෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

එසේම ජනමාධ්‍යවල මිශ්‍ර වැඩ සටහන් ඇරඹීම, සෙසු භාෂාවන්ට හා සංස්කෘතීන්ට ගරු කිරීමට ළමා පරපුර හුරුපුරුදු කිරීම භාෂා දැනුම මනින විවිධ තරග මෙහෙයවීම වැනි පියවර රැසක් ජනමාධ්‍ය මගින් දියත් කළ හැකි යයි මා සිතනවා.

ලංකාව වැනි රටක ද්විභාෂා දැනුම වැදගත් වන්නේ ජනවාර්ගික කොටස් අතර තවමත් පවතින සැකය හා අවිශ්වාසය දුරු කළ හැක්කේ සන්නිවේදනය මගින් නිසයි. උතුරේ හෝ නැගෙනහිර වෙසෙන දෙමළ, මුස්ලිම් ජනතාවට දෙමළ බසින් අමතා දකුණේ අප තුළ පවතින සුහද හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා රටේ ජනමාධ්‍ය ඔස්සේ විවිධ වැඩසටහන් නිෂ්පාදනය කළ හැකි නම් එය වාර්ගික සුහදත්වය ගොඩනැගීමට ලොකු රුකුලක් වේ. දෙමළ මාධ්‍ය එයින් එබඳු සිංහල විශේෂාංග ඉදිරිපත් කිරීම අවශ්‍යයි.

භාෂාව, සංස්කෘතිය, කලාව කියන්නේ එකිනෙකට බැඳුණු මාධ්‍යයන් බව අප තේරුම ගත යුතුයි. මේවායේ එකිනෙකට ආවේණික ස්වාධීන ලක්ෂණ තිබුණත් ඒවායේ සංවර්ධන ක්‍රියාවලියේ දී එකිනෙක හා බැඳී පවතින අයුරක් දැකිය හැකියි. දෙමළ ජනයාගේ සංස්කෘතිය හෝ කලාව තුළ ඔවුන් ජනවිශ්වාසය රුචි අරුචිකම් පිළිබිඹු වීම වැළැක්විය නොහැකියි. සිංහල ප්‍රජාව සම්බන්ධයෙන් එය සාධාරණයි. ජනමාධ්‍ය මගින් කළ යුතු වන්නේ අනෙක් ජනවර්ගයකට අයත් සංස්කෘතික කලාංග යන්ට ගරු කිරීමට අවශ්‍ය සංයමය සෙසු ජන කොටස් තුළ ගොඩනැගීමයි. එහෙත් මෙය නිසි ලෙස ඉටු වෙනවාද කියන එක ගැටලුවක්. උදාහරණයක් වශයෙන් ගතහොත් අද ඇතැම් ටෙලිනාට්‍ය, චිත්‍රපට ආදියේ අනෙක් ජාතීන්ගේ භාෂා විලාශය ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත් වැනි දෑ අපහාසයට ලක් කරන ජවනිකා දක්නට ලැබෙනවා. දුරදිග නොබලා කෙරෙන මෙවැනි කටයුතුවලින් සිදුවන්නේ වාර්ගික සුහදත්වය යළි යළිත් කඩතොලු කිරීමයි.

අපේ ජනමාධ්‍යයේ අවධානය යොමු විය යුත්තේ රටේ වෙසෙන විවිධ ජන කොටස් සතු භාෂා කලා හා සංස්කෘතික අනන්‍යතා අගය කරන ගමන්ම ඒවායේ සමම්ශ්‍රණයක් මගින් ශ්‍රී ලාංකිකත්වය ඉස්මතු කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබාදීමය කියා මා සිතනවා. ශ්‍රී ලංකාවේ වෙසෙන ජනයා සිංහල, දෙමළ හෝ මුස්ලිම් අනන්‍යතා ප්‍රකට කරන අතරම ජාතියක් වශයෙන් ශ්‍රී ලාංකිකයන් ලෙස සිතන ප්‍රජාවක් බවට පත් කිරීම වැදගත් වෙනවා.

මෙවැනි පුළුල් ජාතික වැඩ පිළිවෙළකට මුලපිරිය හැක්කේ රටේ වෙසෙන මාධ්‍යවේදීන්, කලාකරුවන් ඇතුළු වියතුන්ගේ මැදහත්වීමෙනුයි.

# භාෂා විවිධත්වය ශ්‍රී ලාංකේය උරුමයක්

ඇත්ත ප්‍රධාන කර්තෘ

**මයිකල් ප්‍රනාන්දු**

ලංකාවේ බොහෝ මාධ්‍යය ජාතිවාදී අන්දමින් කටයුතු කරන බව මගේ නිරීක්ෂණයයි. ඒ අතරින් අතලොස්සක ප්‍රමාණයක මාධ්‍යයන් ද්වි භාෂා අයිතිය සම්බන්ධයෙන් සුළුවෙන් යම් යම් දේ ප්‍රසිද්ධ කරන්න උත්සාහ කරන බවත් දක්නට ලැබෙනවා. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ සිදුවන ඇතැම් දේවල් සාමාන්‍ය ලෙසට ප්‍රචාරයක් ජනමාධ්‍ය මගින් ලබා දෙන්න උත්සාහ කරන බවත් පේනවා. එහෙත් මේ කිසිවක් දැනුවත්ව හා විධිමත්ව කරන බවක් කිව නොහැකියි. පවතින ජනමාධ්‍ය අතරින් 'රාවය' හා 'ඇත්ත' වැනි පුවත් පත් ඒ පිළිබඳ දැනුවත් යමක් කිරීමට උත්සාහ කරන බව පෙනෙනවා. රජයේ මාධ්‍යයන්ගෙන් 'භාෂා අයිතිය' වැනි මාතෘකා වෙනුවෙන් ප්‍රමාණවත් ඉඩක් ලබාදී නැහැ. මේ ගැන දැනුවත් නැතිවීම ඊට හේතුව විය හැකියි. අපේ මාධ්‍යවේදීන් බොහෝ අය ප්‍රගතිශීලීයි. ඒ නිසා ඔවුන් මේ පිළිබඳ දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස මම දකිනවා. දැනට නම් ඔවුන්ගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව ඉතා පැහැදිලියි.

මේ සඳහා අවම වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් තිබෙනවා. උදාහරණයක් ලෙස ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති 1956 ක්ෂණික දුරකථන අංකය සියලු මාධ්‍ය ඔස්සේ නිතර ප්‍රචාරය කළ හැකියි. ඒ මගින් මේ ප්‍රශ්න පිළිබඳ ජනතාව අතර උනන්දුවක් ඇතිකළ හැකියි. භාෂා අයිතීන් හා භාෂා ප්‍රතිපත්තිය කුමක්දැයි සියලු මුද්‍රිත මාධ්‍ය මගින් නිතර ප්‍රචාරය කළ හැකියි. අපේ රටේ භාෂාවන් පිළිබඳ මහාචාර්යවරු, ප්‍රවීණයන් ඉන්නවා. ඔවුන්ගේ උපදෙස් මත ඔවුන් විසින් භාෂාව අයිතීන් සම්බන්ධයෙන් ලියූ ලිපි පළ කළ හැකියි.

විද්‍යුත් මාධ්‍යය ගතහොත් ඒවාහි සිංහල ජනතාව සඳහා දෙමළ පාඩම් මාලාවත්, දෙමළ ජනතාව සඳහා සිංහල පාඩම් මාලාවක් ඉදිරිපත් කළ හැකියි. එම පාඩම රාජ්‍ය පුවත් ආයතන (ලේක්හවුස් වැනි) වල පුවත් පත් වල පළකර තවත් විදියකට දායක විය හැකියි. මේ සඳහා මාධ්‍ය ආයතනවලට ද වෙනත් ආකාරයක ප්‍රතිඵල අපේක්ෂා කළ හැකියි.

පසුගිය කාලයක භාෂා අමාත්‍යාංශය මගින් මෙවැනි පාඩම් පන්ති පැවැත්වුණා. ඒවාහි සීඩී තැටි තවමත් ඇති. දැනට වුණත් ඒවා මාධ්‍ය මගින් ප්‍රචාරය කළ හැකියි. භාෂා අයිතිය සම්බන්ධයෙන් ලාංකික සමාජය දැනුවත් කිරීම ඉතා පහසුයි. එය මෙරට සංස්කෘතියට ආවේණික ගුණාංගයක්.

"ෂඩ් භාෂා පරමේශ්වර" යන යෙදුම මෙරට සංස්කෘතියේ ඉතා ප්‍රකට ව භාවිතා වෙනවා. භාෂා දැනුම සඳහා මෙරට සංස්කෘතියේ ඉහළ පිළිගැනීමක් ලැබෙනවා. භාෂා දැනුම ජාතීන් අතර සංහිඳියාව ඇති කරන්න ඉතා ප්‍රයෝජනවත්.

මේ සියලු දෙයින් ඔබ්බට ගිය විවිධාකාර භාෂා අයිතීන් ජනතාවට තහවුරු කර දීම සඳහා මාධ්‍ය ඉවහල් කර ගත හැකියි.

අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය එකට එක්ව මුළුගැන්වී ඇති භාෂා අයිතීන් ජනතාවට දැනුවත් කිරීමට විවිධ වැඩසටහන් හරහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි.

භාෂා අයිතීන් පිළිබඳ හැරුණු විට සංස්කෘතිය, කලාව ආශ්‍රිතව ජනමාධ්‍යයට කළ හැකි මෙහෙවර ඉතා විශාලයි.

අපේ රටේ ලේඛකයන්, කවියන්, නළු නිළියන්, සංගීතඥයන්, දේශපාලඥයන් පිළිබඳ දැනුවත් කෙරෙන ලිපි භාෂා දෙකෙන්ම පාඨකයා අතට පත්විය යුතුයි. පරිවර්තන ලිපි පුවත් පත් වලින් ඉදිරිපත් කර සමාජය විද්‍යුත් මාධ්‍යය මගින් භාෂාව, සංස්කෘතිය, කලාව සම්බන්ධ විශේෂාංග ද්විභාෂාවෙන් ඉදිරිපත් කළ හැකියි.

භාෂා අයිතිය පිළිබඳ දැනුවත් කෙරෙන කතන්දර, කවි, චිත්‍රපට යනාදිය යොදවා ගනිමින් විවිධ වැඩසටහන් ජනමාධ්‍යයන්හි බලධාරීන්ට ප්‍රචාරය කිරීමට හැකියාව තිබෙනවා.

මේ සියල්ලටම වඩා පළමුව භාෂාන්තර සම්බන්ධතා වැනි තනතුරක් මෙරට පත් කරගෙන ඒ හරහා භාෂා අයිතීන් පිළිබඳ රටවැසියන් දැනුවත් කිරීමේ ක්‍රමයක් ඇති කළ යුතුයැයි අවසාන වශයෙන් මම යෝජනා කරන්න කැමතියි.

# ජනමාධ්‍යයට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ හැකියි

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය

**වාසුදේව නානායක්කාර**



ද්විභාෂා අයිතිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා අපි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ සඳහා ජනමාධ්‍යයෙහි අනුග්‍රහය ද ඉතා වැදගත්. එබැවින් අප හැම විටම අපගේ ක්‍රියාකාරකම් සඳහා ජනමාධ්‍යයෙහි සහයෝගය ලබා ගැනීමට උත්සාහ කරනවා. එහෙත් අප බලාපොරොත්තු වන පමණට එම අනුග්‍රහය නොලැබීම කණගාටුමට කරුණක්.

ඒ වෙනුවට ජනමාධ්‍යයෙහි විශාල ඉඩක් වෙන්වෙන්නේ සමාජයට අහිතකර වාර්තාකරණයන් සඳහා බව දක්නට ලැබෙනවා. සියදිවි නසාගැනීම්, මිනීස් ඝාතන, ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා සහ කිසිදු ප්‍රවෘත්තිමය වටිනාකමක් නැති ඕපාදූප සඳහා විශාල ඉඩක් වෙන් කරන මෙම ජනමාධ්‍ය භාෂා අයිතිය වැනි මහජනයාගේ ප්‍රධාන අයිතිවාසිකම්වලට අදාළ ප්‍රවෘත්ති සඳහා ප්‍රමාණවත් ඉඩක් සැලසීමට පසුබානවා. අද මේ රටේ ජනමාධ්‍යයෙහි පවතින සැබෑ තත්ත්වය එයයි. භාෂා අයිතිය වැනි තේමාවක් යටතේ ලියැවෙන ප්‍රවෘත්ති පිළිබඳ පාඨක රුචියක් නොමැතිවීම මීට හේතුව බව සමහරවිට අසන්නට ලැබෙනවා.

කෙසේ වෙතත් යම් යම් වැඩසටහන් සඳහා ජනමාධ්‍ය මගින් විශේෂිත අනුග්‍රහයක් ලැබෙන බව ද ස්තුති පූර්වකව සඳහන් කළ යුතුයි. උදාහරණයක් ලෙස, පසුගිය කාලයේ භාෂා අයිතීන්ට අදාළව අප ආරම්භ කළ '1956' ක්ෂණික දුරකථන ඇමතුම් සේවය පාඨකයාට හඳුන්වා දීම සඳහා ජනමාධ්‍ය මගින් ලැබුණු අනුග්‍රහය විශේෂයෙන් අගයකළ යුතුයි. භාෂා අයිතීන් කඩවීමේ අවස්ථා සහ භාෂා ගැටලු පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට අප මෙම ජංගම දුරකථන අංකය හඳුන්වා දුන්නා. එය අද සාර්ථකව ක්‍රියාත්මක වීම පිටුපස ඇති ප්‍රධාන සාධකයක් වන්නේ ජනමාධ්‍ය මගින් ලැබුණු අනුග්‍රහයයි.

පසුගිය කාලයට සාපේක්ෂව භාෂා අයිතීන් පිළිබඳව ජනමාධ්‍යවේදීන් දැනුවත් භාවය ද යම් ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති බවක් දක්නට ලැබෙනවා. විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ජනමාධ්‍යය ද සහභාගී කර ගැනීම ඊට හේතුවිය හැකියි. ඒ අනුව තමන්ගේ මාධ්‍ය මගින් සමාජය වෙත ගෙනයාම ජනමාධ්‍යයෙහි වගකීමයි.

ජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම පැවරී තිබෙන්නේ ජනමාධ්‍යයටයි. ප්‍රාදේශීය මට්ටමෙන් සෑම ප්‍රධාන නගරයක ම පාහේ විභාෂා කවුළු ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය කටයුතු යොදමින් සිටිනවා. දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය නිලධාරීන්, මහජනතාව ඇතුළු සමාජයීය දැනුවත් කිරීමේ විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කරනවා. මේවා කිසිවක් මාධ්‍යය හරහා සමාජයට ඇස ගැසෙන්නට ඉඩ ලබා නොදීම වරදක්. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, වෙළඳ ප්‍රචාරක දැන්වීම්වලට ලබාදෙන ප්‍රචාරය භාෂාවේ උන්නතියට, භාෂා අයිතීන් සඳහාත් ලබා දෙනවා නම් භාෂා අයිතීන් පිළිබඳ සමාජය මීට වඩා ගැඹුරින් දැනුවත් වේවි.

භාෂා අයිතිය හැරුණු විට සංස්කෘතික විවිධත්වය තහවුරු කිරීම සඳහාත් ජනමාධ්‍යයට විශාල මෙහෙවරක් ඉටුකළ හැකියි. සාහිත්‍ය හා කලාව මගින් විවිධ සංස්කෘතීන් අතර සහජීවනය ඇති කිරීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීමේ හැකියාව ජනමාධ්‍ය සතුව තිබෙනවා. ඒ සඳහා ජනමාධ්‍ය සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ඊට අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රජා සංවිධානවල ද වගකීමක්.

# භාෂා අයිතීන් ප්‍රවර්ධනයේ පැමිණි මග සහ ඉදිරි මග

මහාචාර්ය
එස්.එම්. හස්බුල්ලා විසිනි.

**සුළුතර ජාතිකත්ව ප්‍රජාවන්හි භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන පිළිබඳ ප්‍රතිචාර රැසක් මේ වන විට ඉදිරිපත් වී ඇත. පහත දැක්වෙන්නේ මහාචාර්ය එස්.එම්. හස්බුල්ලා මහතා මෙම භාෂා අයිතීන් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ අගැයීමක් කරමින් ඉදිරිපත් කරන ලද අදහස් ඇසුරෙන් සකස් කරන ලද ලිපියකි. ව්‍යාපෘතිය මගින් ලබාගත් ජයග්‍රහණයන් පිළිබඳ මෙන්ම තවදුරටත් මෙම වැඩසටහන සංවර්ධනය කළයුතු ආකාරය පිළිබඳ නිර්දේශ කිහිපයක් ද ඔහු මේ මගින් ඉදිරිපත් කරයි.**






ප්‍රමුඛ සිවිල් සමාජ සංවිධානයක් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් මහාචාර්ය එස්.එම්. හස්බුල්ලා මහතා විසින් අගැයීමට ලක් කෙරිණි. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් වෙත මූලික අවධානයක් සහිතව සුළුතර ප්‍රජාවන් හී මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුයේ ශ්‍රී ලංකාව යුද්ධය සහ ජනවාර්ගික සතුරු භාවය වෙතින් සාමය සහ ස්ථාවරත්වය වෙත පරිවර්තනය වෙමින් පැවති කාල වකවානුවක දීය.

යුද්ධය අවසන් වී ගෙවුනු වසර 4 ක කාලය තුළ ලබා ගත් ජයග්‍රහණයන් නම් වූ විෂයය විවාදාත්මක ස්වරූපයක් ගනී.

යුද්ධයට සහ ගැටුමට ගොදුරු වූවන්, විශේෂයෙන්ම කිවහොත් රටේ සුළුතර ජන කණ්ඩායම් තමන් මෙරට දශක කිහිපයක් තිස්සේ අත් විඳි වෙනස්කම් කරනුලැබීමේ හා කොන් කරනු ලැබීමේ වේදනාවන්ගෙන් තවමත් මිදී හෝ යථාතත්වයට පත් වී නොමැත.

නමුත් රටේ සමස්ථයක් ලෙස ගත් කළ හඳුනාගතහැකි වෙනසක් සිදුව ඇති ක්ෂේත්‍රයක් ද දක්නට ලැබේ.එනම් භාෂා අයිතීන් ක්‍රියාවට නැංවීමයි.මේ රටේ දෙමළ භාෂාව කතා කරන අය අත්විඳි ඓතිහාසික අසාධාරණය සැලකිල්ලට ගත් කළ මෙය සාධනීය වෙනසකි.දෙමළ භාෂාව අහිමිකිරීම දෙමළ සුළුතර ජන කණ්ඩායමේ අයිතීන් අහිමිකිරීමක් බව මෙන්ම පසුගිය වසර 30 ක් පුරා පැවති ජන වාර්ගික යුද්ධය දක්වා වර්ධනය වූයේ ද එය බවට බොහෝ දෙනාගේ එකඟතාවය පවතී.

රටේ සුළුතරයගේ භාෂාව ඇතුළු රටේ ප්‍රධාන භාෂා දෙක භාවිතයේ ඇති අයිතියෙහි සාධනීය වෙනස්කම් ගණනාවක් සිදුව ඇත.මෙහි ගෞරවය හිමිවිය යුත්තේ සමස්ථයක් ලෙස ගත් කල මේ සඳහා රාජ්‍ය ප්‍රවේශයෙහි ඇති වී ඇති වෙනස හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් නිසිකලට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙතය.ඒ සමගම තම භාෂාව භාවිත කිරීමේ අයිතිය මෙන්ම අනෙකුත් ජාතීන් හට ඔවුන්ගේ භාෂාවන් භාවිතයට ඇති අයිතිය පිළිබඳව වන අවබෝධයෙහි ද ඉහළ යාමක් පවතී. රටේ වත්මන් භාෂා අයිතීන් හා භාෂා භාවිතය පිළිබඳව වූ තත්වය කෙරෙහි සාධක ගණනාවක් දායක වී ඇත.

ප්‍රධාන වශයෙන් භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම ඉලක්ක කර ගත් ව්‍යාපෘතීන් මේවායින් එක් සාධකයකි.සැලකිය යුතු මට්ටමක ප්‍රශංසා කටයුතු බවක් හා ඵලදායකත්වයක් සහිත වූ ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් කෙරෙහි මූලික අවධානයක් සහිතව ශ්‍රී ලංකාවේ සුළුතර ජන කණ්ඩායම් වල මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.

මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ මූලික සාධකවූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කැපවීම, අතීත අත්දැකීම් ,භාෂාව සහ අනෙකුත් ඒ හා සමාන ගැටළු හා සබැඳි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ අතීත ක්‍රියාකාරී වාර්තාවන් මෙන්ම මෙම ව්‍යාපෘතියෙහි දී පල වූ එහි හැකියාව ධාරිතාව හා මෙය ක්‍රියාත්මක කිරීමෙහි දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙන් වූ අධිෂ්ඨානය යනාදියයි.

මෙම ව්‍යාපෘතිය තුළින් උගත් පාඩම් ගණනාවකි.මෙබඳු ව්‍යාපෘතියක් යුද්ධයෙන් පසු ආසන්න කාලයෙහි දීම දියත් කිරීමට, අවශ්‍ය නීතිකරණයන් පැනවීම පිණිස රාජ්‍ය උනන්දු කරවීම,භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම් සුදුසු සහ පිළිගත් විනිශ්වය මණ්ඩලයන් හි දී අභියෝගයට ලක් කිරීම, පැහැදිලි ව්‍යාපෘති දැක්මක් සහිතව භාෂා අයිතිවාසිකම් පිළිබඳ වූ පණිවිඩය බිම් මට්ටමට රැගෙනයාම යනාදිය මෙම ව්‍යාපෘතියෙහි ඇතැම් සාධනීය ප්‍රතිඵලයන් වේ.

ව්‍යාපෘතියේ පණිවිඩය වූ භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පුළුල් ලෙස ප්‍රජාව තුළ අවබෝධ වූ හා පිළිගනු ලැබූවකි. එසේ වූවද භාෂා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම රට පුරාම සියළු මට්ටම්වලදී ව්‍යාපෘතිය නිසිලෙස ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සම්පත් සැපයීම ඇතුළු ආකාර ගණනාවකින්ම

වැඩිදියුණු කළ යුතුව ඇත.

අවධි දෙක තුළ දීම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම තුළින් උගත් පාඩම් සැලකිල්ලට ගෙන භාෂා අයිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ඉදිරියට කරගෙන යා යුතු යයි මෙම අගැයීම මගින් නිර්දේශ කෙරේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී එහි අපේක්ෂිත අරමුණු සාක්ෂාත්වීම සිදු වී ඇති බවට වූ සාක්ෂි අගැයීමෙහි දී හමු විය.එ එබැවින් අවශ්‍ය වෙනස්කම් සහිතව ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යා යුතු යැයි මෙම අගැයීම මගින් ප්‍රබල ලෙස නිර්දේශ කෙරේ.

**තිරසාර බව සහ අඛණ්ඩ බව**

මැදිහත්වීම් සඳහා සුදුසු වන බවට ව්‍යාපෘතිය මගින් හඳුනාගත් මූලික භාෂා අයිතීන් පිළිබඳව වූ ගැටළු එනම් නාම පුවරු ,චක්‍රලේඛ යනාදිය පරිවර්තනය කිරීම යනාදිය උචිත මෙන්ම කාලෝචිත ද වේ.කෙසේ නමුත් අනාගතයේ දී වඩා නිර්මාණශීලී හා නවීකරණයෙන් යුතු ක්‍රමවේදයන් භාවිත කරමින් භාෂා ගැටළු හඳුනාගැනීම අවශ්‍ය වේ.

මක්නිසාද යත් මැදිහත්වීම් සිදුකිරීම සඳහා අලුතින් ඉස්මතු වන භාෂා ගැටළු මෙම ක්‍රියාවලියෙහි අන්තර්ගත කිරීම අවශ්‍ය වන බැවිනි.

භාෂා සංගම් - ව්‍යාපාතිය මගින් බිම් මට්ටමේ මේවා ස්ථාපිතකරනු ලැබුයේ භාෂා අයිතිවාසිකම් පිළිබඳව වූ ගැටළු සම්බන්ධයෙන් ස්වාධීන ලෙස කටයුතු කිරීම සඳහාය.

මෙය නව්‍ය සහ නිර්මාණශීලී ඇරඹුමකි.භාෂා සංගම්හි ක්‍රියාකාරීත්වය මිශ්‍ර වූවකි.ඇතැම් සංගම් බලාපොරොත්තු වූ මට්ටමට ක්‍රියාකාරී වූ අතර තවත් අනෙක් ඒවා තමන් පවතින හේතුව පිළිබඳව අස්ථිරබවකින් යුතු විය. දැනට නිර්මාණය කර ඇති භාෂා සංගම් වඩා පණගැන්වීම හා ශක්තිමත් කිරීම සඳහා වූ ඉඩ කඩ පවතී .මේ සඳහා බාහිර සහය, පුහුණුව හා නිරීක්ෂනය අවශ්‍ය වේ.මෙහි දී මතුවන ප්‍රශ්නය වන්නේ මෙම අවශ්‍යතාවයන් ඉටු කළ හැකිද? හා ඒවා ඉටුකරන්නේ කවුරුන් විසින්ද ? යනාදියයි.

**පුහුණුකරුවන් පුහුණු කිරීම**
(TOT)-

ව්‍යාපෘතිය හා සම්බන්ධ වූ බොහෝ දෙනා භාෂා අයිතීන් උදෙසා කටයුතු කිරීම පිළිබඳව විශාල අත්දැකීමක් හා අවබෝධයක් ලබා ගත් හ.මෙම පුහුණුව ලැබූ අය කියා සිටින්නේ පුහුණුව තුළින් තමන් විශාල දැනුමක් ලබාගත් බව සහ කාර්යය දිගටම කරගෙන යාම සඳහා ,ව්‍යාපෘතිය සහිතව හෝ නොමැතිව වැඩිදුර පුහුණුවක් ඔවුන්ට අවශ්‍ය බවය.

**ජාලය**

ව්‍යාපෘතියේ ඉලක්කය වූයේ ව්‍යාපෘතිය තුළින් ඇතිවන භාෂා අයිතිවාසිකම් ජාලයක් ස්ථාපිත කිරීමයි. එමගින් ඉතිරිව පවත්නා භාෂා අයිතීන් පිළිබඳව වූ ගැටළු පිළිබඳව අන්‍යෝන්‍ය ලෙස බෙදාහදාගන්නා ආකාරයකින් කටයුතුකිරීම බලාපොරොත්තු විය. අවාසනාවකට මෙන් සැලසුම් කළ දේ එසේම සිදු නොවිණි. එසේ වුවද, භාෂා අයිතීන් සම්බන්ධ ක්‍රියාකාරකම්හි නියැලෙන ජාලය ප්‍රකෘතිමත් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ ඉඩකඩ සැමවිටම පවතී.

එය එසේ සිදු වේ නම් භාෂා සම්බන්ධ රජයේ නිලධාරීන්, රජය විසින් ස්ථාපිත කරන ලද භාෂා සංගම් සහ ජනමාධ්‍යයන් වැනි අනෙකුත් උනදුවක් දක්වන පාර්ශවයන් මෙම කරුණ සම්බන්ධයෙන් සිදුවන අනාගත ජාලකරණයක (NETWORKING) එකිනෙකට සම්බන්ධකරනු ලැබිය හැකිය.

**මීළඟ අදියර /අඛණ්ඩතාවය සඳහා වූ යෝජනා**

- දැනටත් ආමන්ත්‍රණය කරණු ලැබී ඇති ඇතැම් ගැටළු නව්‍ය සහ නැවත සලකා බැලෙන තත්වයක තබා ගත යුතුව ඇත.
- අලුතින් පැන නගින සහ නව ගැටළු වැඩි අවධානයකින් යුතුව ආමන්ත්‍රණය කළ යුතුව තිබේ.
- භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීම පිණිස නව ක්ෂේත්‍රයන් හා ප්‍රජාවන් හට ඉඩ ප්‍රස්ථාවන් සැලසිය යුතුව තිබේ.
- තාර්කික වූ ඊළඟ පියවරක් විය යුත්තේ අදාළ ප්‍රදේශයන් හී භාෂා විගණනයන් සිදුකිරීමයි.
- ඉඩකඩ - ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් වල ග්‍රාමනිලධාරී කොට්ඨාශයන් 3000 කට වඩා ඇත.මේ දක්වා ව්‍යාපෘතියේ අදියර දෙකම යටතේ වැඩකටයුතු කරනු ලැබ ඇත්තේ එයින් 150 ක් තුළ පමණි.මේ දක්වා ව්‍යාපෘතිය මගින් මුලතිව් හා කිලිනොච්චියේ ද වැඩකරනු ලැබ නැත.ව්‍යාපෘතියට ජාතික පරිමානයකදී වන ඵලදායකත්වයක් සඳහා අවම වශයෙන් එයින් 1/3 හෝ ග්‍රාමනිලධාරී කොට්ඨාශ 1000 ක මට්ටමට ළගා වීමට උත්සාහ කිරීම අවශ්‍ය වනු ඇත.
- ආවරණය කරනු ලබන්නා වූ ප්‍රදේශයන් හි භාෂා අයිතීන් පිළිබඳව වූ තත්වය නිර්ණය කර ගැනීම සඳහා වන එක් තාර්කික පියවරක් වනු ඇත්තේ එම ප්‍රදේශවල ක්‍රමානුකූල භාෂා විගණනයන් සංවිධානය කිරීමයි.

# ප්‍රතිසන්ධානය හා භාෂා අයිතිය මගින් සහෝදරත්වය ගොඩනැගීම

භාෂාව නිසා වැඩියෙන්ම අසරණ වෙන මිනිසුන් බහුල පළාතක් ලෙස උතුරු හා නැගෙනහිර පළාත් හඳුනාගත හැකියි. මේ අසරණ වෙන මිනිසුන් වෙනුවෙන් හා ඔවුන්ගේ භාෂා අයිතිය වෙනුවෙන් උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 6ක් ඇතුළු කොළඹ දිස්ත්‍රික්කය ද සහිතව සිවිල් සංවිධාන ජාලයක් 2011 දී නිර්මාණය වුණා. 2012 සිට අප සංවිධානය (NCDF) ත්‍රිකුණාමලය දිස්තික්කය වෙනුවෙන් එහි සාමාජිකත්වය ලබා ගත්තා. භාෂා සංගම් 30ක් සමග සහ රාජ්‍ය, පෞද්ගලික, පොදු සංවිධාන රාශියක් සමග භාෂා අයිතිය වෙනුවෙන් අප එක්ව වැඩ කරන අතර, අනෙකුත් දිස්ත්‍රික්කවල සහෝදර සංවිධාන සමග අත්දැකීම් බෙදා ගන්නවා. ඉතා සහෝදරත්වයෙන් අනෙක් ජන වර්ගයා කතා කරන ලියන භාෂාවට සංවේදී වන මිනිසුන් අප ගොඩනගමින් සිටිනවා.

දිස්ත්‍රික්කයේ රාජ්‍ය, පෞද්ගලික සහ පොදු යන සෑම ආයතනයකම භාෂා ගැටළු ගැන සමීක්ෂණ දත්තයන් වලින් අප සංවිධානය පොහොසත්. මේ දත්තයන් මුල් කර ගනිමින් මෙකී ගැටළු විසඳීම සහ සමාජ අවධානයක් දිනා ගැනීම වෙනුවෙන් අප සහ අනෙකුත් දිස්ත්‍රික් සහෝදර සංවිධාන දැන් ක්‍රියාත්මකයි. "සුළුතර ප්‍රජාවගේ භාෂා අයිතීන් ප්‍රවර්ධන ව්‍යාපෘතිය" මේ සඳහා අපට විශාල හයියක් සපයනවා.


සහෝදර සංහිඳියාව සහ ප්‍රතිසංවිධානය ගොඩනැංවීම පාලමක් කරගත යුත්තේ භාෂාව බව අප තහවුරු කර සිටිනවා.

අද කතා කරන්න නිදහසක් නෑ කියන පිරිස තමයි වැඩි. ඒත් කතා කිරීමේ නිදහස වෙනුවෙන් කතා කරන්න නිදහසේ ඉඩ හැදෙන තැන්වලදිත් දැනෙන්න කතා නොකරන එක ගැන අද අපට කතා කරන්න වෙලා තියෙන්නෙ. ඔබ කතා කරන භාෂාව දෙමළද, සිංහලද... ඔබ සිංහල නම් කොහෙ ගියත් වැඩක් කරගන්න, වැඩියෙන් කතා කරන්න, අහන්න ප්‍රිය කරන්නේ සිංහල. ඔබ දෙමළ නම් එය ද එසේමයි. අර අපූරු වචන සෙට් එක සැබෑ සමාජ අරුතක් වෙන්න නම් ඔබ අනෙකාගේ භාෂාවට ගරු කළ යුතුයි.

ඔවුන්ගේ භාෂා අයිතීන් තහවුරු කර ගන්න උදව් කළ යුතුයි. භාෂාව නිසාම ජාතික ප්‍රශ්නය තියුණු වූ හැටි අපි හැදෑරිය යුතුයි. ඒ සඳහා පුළුල් සමාජ සංවාදයක් ගොඩනැගිය යුතුයි. අපේ සංවිධානය කැප වී සිටින්නේ ඒ සඳහායි. අප වැනි තවත් සංවිධාන ගණනාවක් සුළුතර ප්‍රජාවගේ භාෂා අයිතීන් ප්‍රවර්ධන ව්‍යාපෘතිය මගින් ජාලගතව රටපුරා ක්‍රියාත්මකව සිටිනවා. ඉතිහාසයේ අඳුරු පාඩම් හදාරමින් අනාගතය ප්‍රතිසංවිධානය කිරීමේ පුරෝගාමී සමාජ මෙහෙවරක් මේ සංවිධාන ජාලයට ඉටුකළ හැකියි.

**සුරංග රූපසිංහ**

# ජාතිය ගොඩනැගීමට සාහිත්‍ය සන්ධානයක්



**සිලප්පදිගාරම්, මනිමේකලාව, තිරුක්කුරල් වැනි දමිළ ශාස්ත්‍රීය සාහිත්‍ය කෘති සිංහල භාෂාවට පරිවර්තනය කරමින් ද මාර්ටින් වික්‍රමසිංහ වැනි ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ සිංහල සාහිත්‍ය කෘති දමිළ බසටත් පරිවර්තනය කරමින් ද පාසල් පෙළ පොත් නිර්දේශ වලට ඇතුළත් කළ යුතුය.**

**ආචාර්ය දේවනේසන් නේසයියා**

ආචාර්ය දේවනේසන් නේසයියා මහතා යාපනය, මන්නාරම හා මඩකලපුව දිස්ත්‍රික්කයෙහි දිසාපතිවරයෙකු ලෙස සේවය කොට අත්දැකීම් රැසක් ලබා ඇති ලංකා පරිපාලන සේවයේ හිටපු කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

80 දශකය මුල් භාගයේ යාපනය දිසාපතිවරයා ලෙස කටයුතු කළ හෙතෙම පසුව පාරිසරික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා ලෙස කටයුතු කොට විශ්‍රාම ලැබුවේ ය. මේ වන විට ප්‍රකට විද්වතකු ලෙසද සිවිල් සමාජ නිලධාරියකු ලෙස ද සමාජ මෙහෙවරක නිරතව සිටී.

මෙම ලිපි පෙළ මගින් ඔහු දෙමළ භාෂා අයිතිය තහවුරු කරන කෙටි කාලීන හා දිගු කාලීන පියවර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි.

ඊට අදාළව මෙවර ලිපියෙන් අවධානය යොමුකර ඇත්තේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසන් සභා වාර්තාවෙහි නිර්දේශ පිළිබඳවය.

• • • • • • • • •

නාලන්දා විශ්ව විද්‍යාලයේ (යුරෝපයේ පවතින පෞරාණිකම විශ්ව විද්‍යාලයන්ට වඩා බොහෝ පැරණි වූ මෙම විශ්ව විද්‍යාලය ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල පිහිටුවීමට සියවස් ගණනාවකට පෙර විනාශ කරන ලදී) ප්‍රධානීන් ඉන්දියාවේ විවිධ ප්‍රදේශ වලින් පැමිණ තේරීපත්වූ අයවුහ. වඩාත්ම ප්‍රසිද්ධ නායකයින් දෙපළ තමිල්නාඩු ප්‍රාන්තයේ අයවුහ. ශ්‍රී ලංකාවේ පැවතී පැරණිම ජනාවාස වලින් කිහිපයක්, උදා: විල්පත්තුවේ තිබෙන පොම්පරිප්පු ආසන්න වශයෙන් අවුරුදු 2000කට පෙර තමිල්නාඩු ප්‍රාන්තයේ බෞද්ධ ප්‍රජාවගෙන් පැවත ඒ. මෙවැනි සත්‍ය තොරතුරු පුළුල් වශයෙන් පැතිරවීම යහපත් නොවන්නේ ද?

වසර 2000කට පෙර නිර්මාණය වූ මහා කාව්‍යයක්වූ ''සිලප්පදිකාරම්'' නම්වූ ග්‍රන්ථයක් ඇත. මෙය රචනා කළේ ප්‍රවීණ සාහිත්‍යධරයකු වූ දෙමළ ජාතික ජෛන ආගමික භික්ෂුවකි. එමෙන්ම ''මනිමේඛලා'' ග්‍රන්ථය ගනිමු (මෙය රචනා කරන ලද්දේ දෙමළ බෞද්ධ සාහිත්‍යධරයෙකුවූ දෙමළ බෞද්ධ භික්ෂුවක් විසිනි. ඇත්තෙන්ම මුල් කාව්‍යග්‍රන්ථයේ කොටසක් ලෙස මෙය සලකනු ලැබේ. මනිමේඛලා කාව්‍ය බෞද්ධ භික්ෂුනියකගේ කතා වස්තුවක් වේ. කලින් සඳහන් කළ "සිලප්පදිකාරම්" නමැති කෘතියේ. කථා නායිකාවගේ (පත්තිනි දේවිය) ඥාති දියණියකි. "මනිමේඛලාව" ශ්‍රී ලංකාව සමග ගැඹුරින් බැඳී ඇති කෘතියක් වේ. චෝල රජ කුමරකුගේ අනවශ්‍ය බලපෑමෙන් බේරීම සඳහා මනිමේකලාව ශ්‍රී ලංකාවට පැමිණියාය. සිලප්පදිකාරම් සහ මනිමේඛලාව මෙන්ම තිරුක්කුරල් ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය අධ්‍යාපන ආයතන වල සිංහල සාහිත්‍ය විෂය නිර්දේශයට ඇතුළත් විය යුතුය. අනෙක් අතට මාර්ටින් වික්‍රමසිංහ වැනි පුළුල් දැක්මක් සහිත ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ කෘති නිර්මාණ දෙමළ සාහිත්‍ය විෂය ධාරාවට ඇතුළත් වන්නේ නම් ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමට මේවා මහෝපකාරී වනු ඇත. පාසැල් පොත් නිර්දේශ සකස්කරන්නන් තම ප්‍රමුඛතා නිසියාකාරයෙන් නැවත සකසා ගැනීම අත්‍යවශ්‍ය වූවකි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති පවා නැවත නව්‍යකරණයකට ලක් කිරීම ඉතා වැදගත් වන්නේ ය.

සමහර රටවල් ප්‍රධාන වශයෙන් එක් භාෂාවක් කථාකරන ඒවාය. ඇතැම් විට යම් සීමාවන්ට යටත්ව එංගලන්තය, ජපානය, ප්‍රංශය, ජර්මනිය හා තායිලන්තය වැනි රටවල් ද මෙම වර්ගයට ඇතුළත් කරන්නට පුළුවන. ඇතැම් රටවල් ප්‍රධාන වශයෙන් ද්වි භාෂික වන අතර ඒවා ද ඇතැම් සීමාවන්ට යටත් වේ. මෙම ප්‍රවර්ග යට ශ්‍රී ලංකාව, ස්කොට්ලන්තය, බෙල්ජියම හා ස්පාඤ්ඤය

> **අපේ නිර්වචනය කුමක් වුව ද අපේ සැසඳුම දශකයෙන් දශකයට වෙනස් වනු ඇත. නව උප භාෂා සකස් වෙමින් පවතින අතර සමහර පැරණි ඒවා අභාවයට පත් වෙමින් ඇත.**

ඇතුළත් කරන්නට පුළුවන. අනෙකුත් බොහෝ රටවල් පැහැදිලි ලෙසම බහු භාෂිකය. ඉන්දියාව, දකුණු අප්‍රිකාව හා පැරණි සෝවියට් සංගමය මෙම ප්‍රවර්ග යට අදාළ සම්භාව්‍ය නිදර්ශන ය. ඔබේ වර්ගීකරණය සඳහා, ඔබ ඉතිහාසයේ කොතෙක් ආපස්සට යන්නේ ද යන්න මත පමණක් නොව භාෂා කාණ්ඩයක් කෙතරම් විශාල විය යුතු ද හා ඔබේ අවධානය දිනා ගැනීමට භාෂාව සංවර්ධනය වී ඇත්තේ කෙසේ ද යන්න මත ද රැඳෙන බැවින් මෙම නිර්වචන නොමග යවන සුළු විය හැකි ය. නිදසුන් ලෙස පෘථිවි ගෝලය මත විසිරී සිටින ගෝත්‍රික ප්‍රජාවන්ගේ අනේකවිධ භාෂාවන්ගෙන් සැලකිල්ලට ගෙන ඇත්තේ කෝක ද? අපේ නිර්වචනය කුමක් වුව ද අපේ සැසඳුම දශකයෙන් දශකයට වෙනස් වනු ඇත. නව උප භාෂා සකස් වෙමින් පවතින අතර සමහර පැරණි ඒවා අභාවයට පත් වෙමින් ඇත. ඇතැම් විට උප භාෂා කීපයක් විශේෂිත භාෂා ලෙස පිළිගනු ලැබීමේ ක්‍රියාවලියක් ඔස්සේ ගමන් කරමින් තිබෙන අතර භාෂා කිහිපයක් දැන් ඒවායේ භාවිතය හීන වීම ඔස්සේ ඇතැම් විට අභාවයට පත්විය හැකි යයි පිළි ගනු ලැබේ.

සහශ්‍ර වර්ෂ කාලයක් පුරා එවැනි සංවර්ධනයන් සිදුව ඇත්තේ වුව ද නූතන මාධ්‍ය සන්නිවේදනය මෙන් ම තරගය පහසුකරණය ඔස්සේ ක්‍රියාවලිය තුළ වෙනස්කම් හඳුන්වා දෙමින් තිබේ. එක් අතකින් මාධ්‍යය තුළින් විශේෂිත භාෂාවක සංරක්ෂණය හා ව්‍යාප්තිය අභිවෘද්ධියක් ලබන්නට පුළුවන. අනෙක් අතින් මාධ්‍යය එහි තරගකරුවන් ප්‍රවර්ධනය කළ හැකි අතර ඇතැම් භාෂාවන්ගේ අභාවය කඩිනම් කරන්නට පුළුවන. මෙලෙස ඉංග්‍රීසි භාෂාව ලෝකය පුරා වර්ධනය වෙමින් දියුණුව අත් කර ගනිමින් පවතී. ඇතැම් කලාපවල කලාපීය වශයෙන් ප්‍රමුඛ භාෂාව වර්ධනය වෙමින් දියුණුව අත් කර ගනී. නිදසුන් ලෙස චීනයේ හා සිංගප්පූරුවේ නිල චීන භාෂාව (මැන්ඩරින්) කුඩා කණ්ඩායම් විසින් භාවිත කරනු ලබන ප්‍රාදේශීය භාෂාවල පැවැත්ම අනතුරට හෙලමින් පැතිරේ. එසේ වුව ද මාධ්‍යය විසින් ප්‍රාදේශීය භාෂා කිහිපයකට නොනැසී පැවතීමට හා තහවුරු වීමට ආධාර කරනු ලැබ තිබේ.

නිදහසෙන් පසු ඉන්දියාව වහාම සෑම තැනකම ප්‍රමුඛ භාෂාව ලෙස හින්දි භාෂාව යොදා ගැනීමට ප්‍රයත්න දරමින් කටයුතු ආරම්භ කළේ ය. මෙම මුලපිරුමට විශේෂයෙන් දකුණු ඉන්දියාවෙන් දැඩි විරෝධයකට මුහුණ පෑමට සිදු විය. එසේ ම බටහිර බෙංගාලය වැනි වෙනත් ප්‍රාන්ත රාජ්‍යයන්හි ද ඊට විරෝධය මතු විය. ප්‍රතිඵල වශයෙන් ඉන්දියාව දැන් පිළි ගෙන තිබෙන ත්‍රි භාෂා සූත්‍රය එනම් හින්දි, ඉංග්‍රීසි හා අනෙකුත් ජාතික භාෂාවන්ගෙන් එකක් භාවිතා කිරීමේ සූත්‍රය පිළි ගති. මේ භාෂාවන්ගෙන් කුමන හෝ භාෂාවක් පාසල්වල ඉගැන්වීමේ මාධ්‍ය ලෙස ද කුමන හෝ භාෂාවක් විශේෂිත ප්‍රදේශවල පරිපාලන භාෂාව ලෙස හා වාර්තා තැබීමේ භාෂාව ලෙස ද නම්‍යතාවයකින් යුතුව භාවිතා කළ හැකි විය. මෙම සූත්‍රය හොඳින් ක්‍රියාවට නැගුණු අතර සැබවින්ම භාෂා මත පදනම්වූ කැරලි කෝලාහල නැතිව යාම ද බහු භාෂික ප්‍රවීණතාව ක්‍රමානුකූලව තහවුරු වීම ද සිදු විය. විශේෂයෙන්ම ඉංග්‍රීසි භාවිතය ව්‍යාප්ත වන්නට විය.

**මතුසම්බන්ධයි..**

# "අද" ද්විභාෂා පුවත්පතට ඇඩ්ෆෙස්ට් ජාත්‍යන්තර සම්මාන උළෙලේ දී රන් සම්මානයක්

2014 ඇඩ්ෆෙස්ට් (ADFEST 2014) නිර්මාණශීලීත්ව සම්මාන උළෙලේ දී "අද" ද්වි භාෂා දිනපතා ජාතික පුවත්පතට රන් සම්මානයක් හිමි විය. පසුගියදා තායිලන්තයේ මෙම ඇඩ්ෆෙස්ට් සම්මාන උළෙල පැවැත්විණ.

ලියෝ බර්නේට් "ශ්‍රී ලංකා ආයතනය, විජය පුවත්පත් සමාගමේ 'අද ද්විභාෂා" ජාතික පුවත්පත සමග එක්ව නිර්මාණය කරන ලදි. එක්සත් භාවයේ පුවත්පත (Unity paper) සඳහා ප්‍රවර්ධන අංශයේ හොඳම මුද්‍රණ භාවිතය/සම්ප්‍රදායික බාහිර ප්‍රචාරණය (Print/ Conventional Ourdoor) සඳහා වන රන් සම්මානය ද (Promo Lotus Gold ) මෙලෙස හිමි වූ අතර එම අංශයෙන් ලැබිය හැකි ඉහළම සම්මානය ද මෙය වේ.

"අද ද්විභාෂා" පුවත්පත තුළින් මෙම අලුත් සංකල්පය ඉදිරිපත් කිරීම සඳහා ලංකාවේ ප්‍රමුඛ පෙළේ නිර්මාණ ආයතනයක් හා ජාත්‍යන්තර කීර්තියක් දිනා සිටින ස්ටාර් කොම් මාධ්‍ය ආයතනයේ මෙරට ආයතනය වන ස්ටාර් කොම් කලම්බෝ යන මාධ්‍ය ආයතනය අත්වැල් බැඳගෙන කටයුතු කරන ලදි.

ආසියා පැසිපික් කලාපයේ ප්‍රමුඛතම දැන්වීමකරණ මහෝත්සවයක් හා සම්මාන උළෙලක් වන 'ඇඩ්ෆෙස්ට්' සෑම වසරකම තායිලන්තයේ පටායා හිදී පැවැත්වේ.

'අපි එකම එක ධජයක් යටට' යන ප්‍රධාන ශීර්ෂය යටතේ එක්සත් භාවයේ පුවත්පත (Unity paper) ලෙස නම් කෙරුණු මෙම පුවත්පත හරහා 30 වසරක යුද්ධයෙන් පීඩා විඳි ජාතීන් නැවත එක්සත් කරවීමේ වැදගත්කම මතක් කරදීම සිදුකෙරිණ.

# වැරදි පෙන්නුවොත් හදාගන්නවා
## සිදු වූ වරදට සමාව ඉල්ලනවා - වාසු කියයි




**රජයේ බස්රථයක දෙමළ භාෂාව වැරදි ලෙස භාවිතා කර ඇති අයුරු**

දෙමළ භාෂාවෙන් ලියැවී ඇති නාම පුවරු සහ දැන්වීම් පුවරුවල සිදු වී ඇති වැරදි පිළිබඳව තමා දෙමළ කතා කරන ජනතාවගෙන් සමාව ඉල්ලා සිටින්නේ යැයි පසුගිය දිනෙක ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා පැවසීය. "සිදු වී ඇති වැරදි පිළිබඳව අපගේ අවධානය යොමුකළ විට අපි ඒ වැරදි නිවැරදි කර තිබෙනවා. එසේ ම ඒ වැරදි පිළිබඳව වගකීම අපි භාරගන්නවා" යැයි ද අමාත්‍යවරයා පවසා තිබිණි.

ඔහු මෙම ප්‍රකාශය කරන ලද්දේ රජයේ බස් රථයක දෙමළ භාෂාවෙන් තිබූ වරදක් පිළිබඳව ජනමාධ්‍ය මගින් කළ විමසීමකට පිළිතුරු දෙමිනි.

එහි "ගැබිණි මාතාවන් සඳහා" යන දැන්වීම සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් නිවැරදිව සඳහන්ව තිබුණත් දෙමළ පරිවර්තනය විය යුතු "කර්පිනි තායිමාර් ගලුක්කාග" (ගැබිණි මාතාවන්ට වෙන්කර ඇත) වෙනුවට එහි ලියා තිබුණේ "කර්පිනි නායිමාර් ගලුක්කාග" යනුවෙනි. එයින් කියැවෙන්නේ "ගැබිණි බල්ලන් සඳහා වෙන්කර ඇත" යනුවෙනි.

අරුත වෙනස් වී ඇත්තේ එක් අකුරකිනි. එනම් තා (தா) යන දෙමළ අකුර වෙනුවට නා(நா) යන දෙමළ අකුර යෙදීමෙනි. මෙවැනි ගැටලු ඇතිවීමට හේතුව සමහරවිට වාක්‍ය ලියූ අය දෙමළ දැන සිටියත්, දැන්වීම නිර්මාණය කළ අයට භාෂා දැනුමක් නොතිබීම විය හැකි යැයි ද අමාත්‍යවරයා සඳහන් කර තිබිණි.

"මෙවැනි වරදක් පසුගිය දිනෙක පාර්ලිමේන්තුවේදීත් සිදු වූ නමුත් අප ඒ වරද නිවැරදි කළා" යැයි අමාත්‍යවරයා පැවසූ බව BBC උපුටා දක්වමින් Daily Mirror පුවත් පත පෙබරවාරි 07 දා වාර්තා කර තිබිණි.

## මුදල් නෝට්ටුවේ.... 1 වැනි පිටුවෙන්

මහ බැංකුව නැවත අලුතින් මුදල් මුද්‍රණය කෙරෙන අවස්ථාවේ භාෂා තුනටම සමාන අවස්ථා ලබා දෙමින් වරද නිවැරදි කරන බවට එකඟත්වය පළ කර තිබිණි.

මානව හිමිකම් කොමිසම හමුවේ එම එකඟත්වය ඇතිකරගනු ලැබුවේ පසුගිය වසරේ ජූලි 16 දා ය. එදින පැමිණිලි විභාග කිරීමේ අවස්ථාව සඳහා මහ බැංකු අධිපතිතුමා වෙනුවෙන් විනිමය පාලන අධිකාරීවරයා සහ මහ බැංකු නීති නිලධාරීවරයා ද ඊට සහභාගි වී සිටියහ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් හා ජාතික භාෂාවක් ලෙස පිළිගෙන තිබිය දී මෑත නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල පවා "ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කර ඇති මෙම මුදල් නෝට්ටුව ශ්‍රී ලංකාව තුළ ඕනෑම මුදල් ගනුදෙනුවක් සඳහා වලංගුය" යන පාඨය දෙමළ භාෂාවෙන් සඳහන්ව නොතිබීම පිළිබඳව මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ල ඉදිරිපත් කර තිබිණි.

එහි දී එකඟත්වයට පැමිණි පරිදි එම ජූලි 16 වැනිදායින් පසු නිකුත් කෙරෙන මුදල් නව නෝට්ටුවල අත්‍යාවශ්‍ය පාඨ දෙමළ භාෂාවෙන් ද සඳහන්ව තිබිය යුතු වුවත් පසුගිය චෝගම් සමුළුව වෙනුවෙන් නිකුත්කළ රු. 500/- නෝට්ටුව ද දෙමළ භාෂාවට හිමි තැන ලබා නොදෙමින් පළකර තිබිණි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම පැමිණිල්ල ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළේ ඉන් පසුව ය.

2014 මාර්තු 10 දා එම පැමිණිල්ල විභාගයට ගත් ශ්‍රේෂ්ඨාධිකරණය මින් ඉදිරියේ දී නිකුත් කෙරෙන මුදල් නෝට්ටු සියල්ල ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය මත පදනම්ව නිර්මාණය කළ යුතු යැයි නියෝග කළේ ය.

## ඌවේ තැපැල් කාර්යාල ද්විභාෂා ගැටලුවක

**බිබිලේ - වීගොඩ හේමපාල**

බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි තැපැල් කාර්යාලයේ පළකරන දැන්වීම් බොහෝ විට සිංහලෙන් පමණක් පළකිරීම නිසා මෙම ප්‍රදේශවල සිංහල නොදන්නා දෙමළ ජනතාව බලවත් අපහසුතාවකට පත්ව සිටිති.

විශේෂයෙන් බදුල්ල හා මොණරාගල නගර ආශ්‍රිතව වැඩි වශයෙන් දෙමළ ජනතාව ජීවත් වෙති. එහෙත් මෙම තැපැල් කාර්යාල දෙකෙහි ද බොහෝ විට දැන්වීම් ප්‍රදර්ශනය වන්නේ සිංහලෙන් පමණි. එබැවින් මෙම ප්‍රදේශයන්හි ජීවත් වන දෙමළ, මුස්ලිම් ජනතාව තම පහසුව සඳහා දෙමළ බසින් දැන්වීම් ප්‍රදර්ශනය කරන ලෙස වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටිති. පස්සර ලුණුගල ප්‍රදේශවල දෙමළ ජනයා අතර මෙම ප්‍රශ්නය උග්‍රව තිබේ. එබැවින් මෙම ප්‍රශ්නය පිළිබඳ අවධානය යොමුකොට සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම එම දැන්වීම් පළකිරීමට කටයුතු යොදන ලෙස ප්‍රදේශයේ ජනතාව වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටිති.

# ත්‍රෛභාෂිකත්වය මොළයට වදයක් නොවිය යුතුයි

**රජයේ ත්‍රෛභාෂා වැඩ පිළිවෙළ හා එහි ක්‍රියාකාරීත්වය - 4 වැනි කොටස**

**පසුගිය කලාපය හා සබැඳේ...**



> **ජනපති, අගමැති යන දෙදෙනා ප්‍රධාන වශයෙන් ද අමාත්‍ය මණ්ඩලය ද්විතීය වශයෙන් ද ත්‍රෛභාෂිකයන් වීම, රට පාලනය, නීතිරීති සම්පාදනය, ඉංගිරිසි කථා කරන විදේශිකයන් සමග කතාබහ කිරීම ආදී කටයුතුවලට උපකාර වනු ඇත. එබඳු කාරිය ගොවියාට, ධීවරයාට, කම්කරුවාට අදාළ වන්නේ නැහැ. සාමාන්‍යයෙන් දේශපාලනඥයන් කරන්ට හදන්නේ, ත්‍රෛභාෂිකත්වය ඒ ගැන අවශ්‍යතාවක් නොමැති පොදු ජනයා පිට පටවා තමන් ගේ ඇඟ බේරාගැනීමයි.**

ඉංග්‍රීසි බසෙහි ප්‍රවීණත්වය කෙනෙකුට ප්‍රයෝජනවත් වන්නේ අප රට වැසියන් සමග සංවාදනය කිරීම සඳහා නො වේ. ඉංග්‍රීසි කථා කරන රටවල්වලින් අප රටට පැමිණෙන සංචාරකයන් හා ව්‍යාපාරිකයන් සමග කතාබහ කිරීමට ඔවුන්ගේ බස දැන සිටීම ප්‍රයෝජනවත් විය හැකි ය. එහෙත් යුරෝපයෙන් එන අය ඉංගිරිසි කථා කරන්නේ ස්වල්ප වශයෙනි. ප්‍රාංශිකයෝ දැන සිටියත් ඉංගිරිසි කථා කිරීමට අකමැති වෙති. ඇත්ත වශයෙන් අප රට ස්වදේශීන් ඔවුනොවුන් සමග ඉංගිරිසි කථා කරන්නේ එක්කෝ අත හැරිය නොහැකි පුරුද්දක් වසයෙන් හෝ නැත්නම් උජාරුව (snobish - ව්‍යාජ ගර්වය) නිසා ය. පාර්ලිමේන්තුව වැනි දේශපාලන ආයතනයක දී ඉංගිරිසි කථා කරන්නේ එක් අතකින් මහජනයාට තමන් ගැන ආකර්ෂණීය හැඟීමක් ඇති කරගැනීමට ය. එසේම ජාත්‍යන්තරයේ සිත් ගැනීමට ය. මෙබඳු ම ක්‍රියාවලියක් උසාවිවල නීතිඥයෝ ද අනුගමනය කරති. ඒ සිය සේවාදායකයන්ට තම මහන්තත්වය පෙන්වීමටයි. ඇත්ත වසයෙන් පාර්ලිමේන්තුව වැනි තැනක දී එහි සිටින හැම සාමාජිකයෙකුටම එහි කෙරෙන ස්වභාෂා කථාව තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතු අතර, ඊට පිළිතුරු දීම තමා කථා කරන ස්වභාෂාවෙන් කිරීමේ සම්ප්‍රදායයක් ඇති විය යුතු ය. ජනපති, අගමැති යන දෙදෙනා ප්‍රධාන වශයෙන් ද අමාත්‍ය මණ්ඩලය ද්විතීය වශයෙන් ද ත්‍රෛභාෂිකයන් වීම, රට පාලනය, නීතිරීති සම්පාදනය, ඉංගිරිසි කථා කරන විදේශිකයන් සමග කතාබහ කිරීම ආදී කටයුතුවලට උපකාර වනු ඇත. එබඳු කාරිය ගොවියාට, ධීවරයාට, කම්කරුවාට අදාළ වන්නේ නැහැ. සාමාන්‍යයෙන් දේශපාලනඥයන් කරන්ට හදන්නේ, ත්‍රෛභාෂිකත්වය ඒ ගැන අවශ්‍යතාවක් නොමැති පොදු ජනයා පිට පටවා තමන් ගේ ඇඟ බේරාගැනීමයි.

මේ ස්වරයෙන් ත්‍රෛභාෂිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් නගමු. සිංහල කථා කරන ගොවියෙකුට දෙමළ කථා කරන ගොවියෙකු හා කථාබහ කරන්ට නිතර අවස්ථාව ලැබෙනවාද? ඊළඟට ඒ දෙදෙනාම ත්‍රෛභාෂිකයන් වන බැවින් සිංහල දෙමළ වෙනුවට ඉංගිරිසියෙන් කතාබහ කළ නොහැකිද? එසේම සමාජයීය ජංගමය සඳහා සිංහල හෝ දෙමළ ගොවියාට තම පුතා, දුව සමග ඉංගිරිසියෙන් කථා කිරීමේ ප්‍රවණතාවක් ඇති විය නොහැකි ද? යම්කිසි වැඩිහිටි ගොවියෙකුට ත්‍රෛභාෂා තබා ස්වභාෂිත වත් විය නොහැකි අවස්ථාවල, 2012 ත්‍රෛභාෂිකත්වයට මුල පුරන වයස අවු. 15හේ ළමයෙකුට වයස අවු. 25හේ (එනම් 2022කේ) දී වී වගාව පිළිබඳ තමා ඉංගිරිසි පතපොතින් ලබාගත් දැනුම සිය පියාට කියාදිය හැකිද? එසේත් නැත්නම් කළ හැක්කේ තම පියාට 'ගුඩ් මෝනිං' 'හවු ආ යූ' කීම පමණක්ද? අද වයස 40හේ ගෙවිලියකට 2022 දී ආණ්ඩුවේ කන්තෝරුවකට ගිහින්, ආණ්ඩුවේ අද වැඩියෙන් වැඩ කරන ඉංගිරිසියෙන් කථා කොට තමාට අවශ්‍ය පොහොර සහනාධාරය පිළිබඳ පැන නැගුණු ප්‍රශ්නය විසඳා ගත හැකිද? ත්‍රෛභාෂිකය සඳහා මොළයට වද දෙන්නේ නැතුව, කාලය හා මානසික අපහසුතාවට පත් කරන්නේ නැතුව ගොවියෙකුට තම වෘත්තිය නිවී සැනසිල්ලේ කරගෙන යෑමට රජය අත දෙන්නේ නැද්ද?

ත්‍රෛභාෂිතයෙන් පොදු රටවැසියාට, උවමනාවක් නැත්නම් එය අමතක කළ හැකි ය. ආදායම් බදු ගෙවීමෙන් ම රජයට ඒ සඳහා ඔහුට බල කළ නොහැකි ය. එහෙත් පාසල් සිසුවට එසේ කළ හැකි නොවේ. ඔහුට කීප අතකින් ම බේරීමක් නැත. කෙටුම්පතෙහි දක්වන අන්දමට, ඔහු ගේ භාෂා ජීවිතය ඇරඹෙන්නේ 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග යෙනි. පළමුවෙන් ම ඔහුට ගෙදරින් බේරීමක් නැත. ඊළඟට පාසල, අනතුරුව ටියුෂන් මාස්ටර්, අන්තිමට සමාජය. මේ සියල්ල ඔහු ගිලගැනීමට රකුසෙකු මෙන් කට අයාගෙන සිටී. දෙමාපියන්ට තම දූ පුතුන් මේ ශිෂ්‍යත්ව විභාග යෙන් ඉහළින් සමත් නුනොත් සියලු වැඩ වරදී. එමනිසා ළමයා 'ටියුෂන්' පන්තියට යවනු ලැබේ. 'ටියුෂන්' යන වචනය මෙහි යොදන්නේ ඉන් සිදු වන්නේ ළමයාට 'උපකාරයකට' වඩා 'අපකාරයක්' බැවිනි. කුඩා ළමයින් මේ හේතු කොටගෙන විඳින වද හිංසාව අප කවුරුත් දකිතත්, අප එහෙම දෙයක් නැතුවාක් මෙන් අහක බලාගෙන ඉන්නේ සමාජය මගින් වැඩ ගසනු ලැබූ දෙමාපියන් ගේ මානසිකත්වය නිසයි. කොයි තරාතිරමේ වුව ද හැම දෙමාපියෙකුගේ අපේක්ෂාව, තමන්ට සමාජයේ මුදුන් පමුණුවා ගැනීමට නොහැකි වූ දේ, තම දූ දරුවන් මගින් ලබාගැනීමයි. ඒ සඳහා තැබිය හැකි මුල් පියවර මේ ශිෂ්‍යත්ව විභාගයයි.

**ලබන කලාපයට....**

**අමරදාස වීරසිංහ**

සංස්කෘති සඟරාවෙහි 2013 පෙබරවාරි කලාපයෙන් උපුටා ගැනීමකි.




## ප්‍රතිචාර ප්‍රතිචාර ප්‍රතිචාර ප්‍රති

### වැදගත් මෙහෙවරට ආශිර්වාදයක්

සුගත ශාසන වංශ විභූෂණ, දේශභක්ති සද්ධර්මකීර්ති ශ්‍රී සුමනසාර සරණපාල ශාස්ත්‍රපති **පානම ශ්‍රී චන්ද්‍රරතනාභිධාන** වෙල්ලස්ස දිගාමඩුල්ල දෙදසාවේ ප්‍රධාන සංඝනායක ස්ථවිර ශ්‍රී බෝධිරුක්ඛාරාම මහා විහාරය පානම.

ජාත්‍යන්තර වශයෙන් මෙන්ම රටක් වශයෙන් ඔවුනොවුන්ගේ ගෞරවය හා අනන්‍යතාව ආරක්ෂා කරගනු වස් භාෂාව වටිනා කාර්යභාරයක් ඉටු කරන බව දන්නා කාටත් නොරහසකි. මෙය හොඳින් අවබෝධ කර නොගන්නා තෙක් වාර්ගික මෙන්ම භාෂා ගැටලු පැන නගී.

මෙම තත්ත්වය යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මැනවින් තේරුම් ගත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවතත් මේ රටේ සියලු ජාතීන්ට එකම තැනක කටයුතු කිරීමට අවශ්‍ය වාතාවරණයක් සකසනු පිණිස ඉදිරිපත්ව ක්‍රියා කිරීම අගේ කොට සැලකිය යුත්තකි. එපමණක් නොව ජාතිවාදී අරගලයන් මෙරටෙන් තුරන් ව ඇති අවස්ථාවක සියලු දෙනා රට තුළ බේදයකින් තොරව සැරිසරන හෙයින් සෑම ප්‍රදේශයකම සියලු දෙනා ම ඒ ඒ ස්ථානයන් හඳුනා ගැනීමටත් අදහස් හුවමාරු කරගැනීමටත් දෙමළ, සිංහල භාෂා නාම පුවරු ලිපි ලේඛණ තොරතුරු අදහස් ඉදිරිපත් කිරීමේ ආදිය සිදුවන්නේ නම් එය මහඟු සේවයකි. අනාගතයේත් ජාතිවාදී භීෂණයක් ඇතිවීම වැළැක්වීමට එය මහත් ශක්තියකි.

එබැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යහපත් අදහසින් කරගෙන යන වැඩසටහනට අපගේ ආශිර්වාදය නිරතුරුවම හිමි වේ.

"යම් ජාතියකට තම අනන්‍යතාව හා නිදහස භුක්ති විඳීමට නම් තමන්ගේ මව් බස රිසි සේ භාවිතා කිරීමේ පරම අයිතිය ඔවුනට තිබිය යුතු ය."

### වව්නියාවේ දෙමළ භාෂා ගුරු හිඟයක්

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පාසැල් ගණනාවක දෙමළ මාධ්‍ය විෂය ඉගැන්වීමට ගුරුවරු නොමැතිකම හේතුවෙන් එම පාසැල්වල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් මහත් දුෂ්කරතාවයකට පත්ව සිටිති. මෙම ගැටලුවට මුහුණ දී සිටින පාසැල් අතර අලගල්ල, මහකච්චිකොඩිය, පාවක්කුලම යන පාසැල් ද වෙයි. මේ සඳහා විසඳුමක් සපයන ලෙස වව්නියාව දකුණ අධ්‍යාපනය කාර්යාලය වෙත ඉල්ලීම් රැසක් ඉදිරිපත් කර ඇතත් මෙතෙක් විසඳුම් ලැබී නැත.

### විභාෂා පුවත් හසුනට පහළ ඌවෙන් සුබපැතුම්

**ලේකම්**
පහල ඌව ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, බිබිල

විභාෂා සඟරාව ප්‍රමාණයෙන් කුඩා වුවද ඉතා ප්‍රයෝජනවත් සහ අගය කළ යුතු සගරාවකි.මේ මගින් මෙරට සියලු ජනවාර්ගික කණ්ඩායම් අතර සාමය හා සමගිය ගොඩනැගීමට ශක්තියක් ලැබේ.මෙරට සුළුතර ජන කණ්ඩායම්වලට හා ඔවුන්ගේ භාෂා අයිතීන් පිළිබඳ ගැටළු විසඳීමට මේ මගින් මාර්ගෝපදේශයක් සැලසේ.මේ වන විට දෙමළ භාෂාව සිංහල පාසල් වල පවා අනිවාර්ය විෂයක් කර තිබෙනවා.එය හොඳ දෙයක් නමුත් එය පාසලට සීමා නොවිය යුතුය.ද්වි භාෂා අධ්‍යාපනයේ වැදගත්කම මුළු රටම අවබෝධ කර ගත යුතුය.එම අවබෝධය පුළුල් කිරීම සඳහා විභාෂා පුවත් හසුනට විශාල කාර්ය භාර්යයක් කළ හැකිව තිබේ.එම යහපත් කාර්ය ඉටු කිරීමට වෙහෙස දරන විභාෂා සඟරාවට අප සුබ පතමු.

## දිස්ත්‍රික්ක 5ක භාෂා සංගම් සාමාජිකයන් හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කෙරේ



පසුගිය පෙබරවාරි මස 06, 07, 08, පැවති භාෂා සංගම්හි සාමාජිකයන් හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කරලීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 5 ක සාර්ථක අන්දමින් නිමකරලීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජාසහභාගිත්ව අංශය සමත් විය. මහනුවර මාතලේ, මොනරාගල, බදුල්ල, නුවරඑළිය යන දිස්ත්‍රික්ක පහේ පැවති භාෂාව සම්බන්ධ දැනුවත් කරලීමේ වැඩසටහන් සඳහා දහසකට අධික පිරිසක් සහභාගීවූහ.

රාජ්‍ය ද්වි භාෂා ප්‍රතිපත්තිය, භාෂාව හා නීතිය යන මාතෘකා හැරුණු විට භාෂාව සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජාව මුහුණ දෙන බහුවිධ ගැටලු පිළිබඳව ද මෙහි දී සාකච්ඡා විය. ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම හා නිසි පරිදි ක්‍රියාවේ නොයෙදවීම හේතුවෙන් ජනතාවට විඳීමට සිදු වන නොයෙකුත් ගැටලු අකටයුතුකම් හා අසාධාරණයන් මෙහි දී හඳුනාගත හැකි විය. වැඩසටහන මෙහෙයවූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා සහ නීතීඥ එස්.ජී. පුංචිහේවා මහතා විසිනි.

සටහන : **සුදර්ශනී දමුනුපොළ**

## අපට ලියන්න

ශ්‍රී ලංකාවේ භාෂා පිළිවෙත බෙහෙවින් සංවාදයට බඳුන් වූ මාතෘකාවකි. විභාෂා පුවත් හසුන මගින් අප උත්සාහ කරන්නේ එම සංවාදය තව දුරටත් පෝෂණය කිරීමටය.

මෙම සංවාදය ගොඩනැගීමේ දී පාඨක ඔබගේ දායකත්වය ද අතිශය වැදගත් බව අපගේ විශ්වාසයයි. ඔබ සතු විවිධ අදහස්, තොරතුරු, ප්‍රවෘත්ති, අප වෙත ලියා එවන්න.

විභාෂා පුවත් හසුන මෙරට භාෂා අයිතිය පිළිබඳ සංවේදී ඔබ සැම වෙනුවෙන් විවෘතය.

**භාෂා අයිතිය පිළිබඳ**

ඔබේ අදහස්, යෝජනා ප්‍රතිචාර ගැටලු අප වෙත යොමු කරන්න.



සංස්කාරක,
විභාෂා පුවත් හසුන,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
24/2, 28 වෙනි පටුමග,
මල්පාර, කොළඹ 07
දුරකථනය : 0112 370801/4
ෆැක්ස් : 0112 370802



ප්‍රථම වරට නිවසට ලිපිනයක් හිමි වූ දැරියකගේ සතුට



# විලාසම කැමරා ඇසින්

වතුකම්කරු පවුල් සඳහා ස්ථිර ලිපිනයන් ලබා දීමේ සමාජ සත්කාර වැඩසටහන පස්සර ප්‍රාදේශිය බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වූ අවස්ථාවේ විභාෂා කැමරා ඇසට හසු වූ දර්ශන කිහිපයක් මෙහි පළ වේ.

විලාසම යන නමින් හැඳින්වෙන මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ වතුකම්කරුවන් සඳහා නිශ්චිත ලිපිනයක් සහතික කිරීම සහ එම ලිපිනයට නියමිත පරිදි  සාමාන්‍ය තැපැල් ක්‍රමය යටතේම ලියුම් ලැබෙන්නට සැලැස්වීමයි.

අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් ලෙස පස්සර ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ මෙම වැඩසටහනින් ප්‍රතිලාභ අත්වන පුරවැසියන් ප්‍රමාණය 3000කට ආසන්නය.




විනයාගර් පුරම් නාම පුවරුව ඉදිකිරීමෙන් පසු





ලිපිනයන් හිමි වූ නිවෙස් කරා නිරීක්ෂණයට ගිය කොමසාරිස් කාර්යාලයේ නියෝජිතවරිය ප්‍රදේශයේ ජනතාව සමගින්





විලාසම වැඩසටහන අතර ප්‍රදේශවාසීන් අදහස් හුවමාරුවක



විලාසම ව්‍යාපෘතියේ මහජන හමුවක අවස්ථාවන්

Printed by: Globe Printing Works, No.5 Stork Place, Colombo 10. Tel: 0777315971